# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

## ஆண்டிற்கான செயற்திறன் அறிக்கை

## ANNUAL PERFORMANCE REPORT

# 2014

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

## காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்

## Land Commissioner General’s Department

## ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන්
අමාත්‍ය - ඉඩම් හා ඉඩම් සංවර්ධන

ගරු සිරිපාල ගමලත්
නියෝජ්‍ය අමාත්‍ය - ඉඩම් හා ඉඩම් සංවර්ධන

ටී. අශෝක පීරිස්
ලේකම්, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ආර්.පී.ආර්. රාජපක්ෂ
ඉඩම් කොමසාරිස් ජනරාල්

පී.ඩී. ඉන්දිකා එල්. විජේගුණවර්ධන
ඉඩම් කොමසාරිස් (ඉඩම්)

ඩබ්.ඩබ්.ඒ. චන්ද්‍රා
ඉඩම් කොමසාරිස් (සංවර්ධන)

ඩී.ඒ. අසන්ත ගුණසේකර
ඉඩම් කොමසාරිස් (පාලන)

බී.ආර්. සේනාරත්න
ඉඩම් කොමසාරිස් (නීති)

එෆ්.එච්.එල්.එම්.පී.ද සිල්වා
ප්‍රධාන ගණකාධිකාරී

## ප්‍රාදේශිය කාර්යාල

නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය - අනුරාධපුර
ර්.එම්.එම්.ඒකනායක
නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්

නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය - පොළොන්නරුව
ආර්.එම්.ඩී.පී.පුෂ්ප කුමාරි
නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්

නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය - අම්පාර
ඩී.ඩී.එස්.තක්ෂිලා ගුණරත්න
සහකාර ඉඩම් කොමසාරිස්

නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය - දෙබරවැව
ඩබ්.සී.එස්.කේ. රත්නායක
නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්

නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය - මහියංගණය
ආර්.එම්.එන්.සී. හේම කුමාර
සහකාර ඉඩම් කොමසාරිස්

නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය - ත්‍රිකුණාමලය
කේ.ජී.ඒ.කේ. පලුගස්වැව
සහකාර ඉඩම් කොමසාරිස්

සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය - මොණරාගල
ඩබ්.සී.එස්.කේ. රත්නායක
නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්

සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය - කන්තලේ
කේ.ජහන්නාත්
සහකාර ඉඩම් කොමසාරිස්

## දෙපාර්තමේන්තු දැක්ම

“රාජ්‍ය ඉඩම්

කළමනාකරණයේ

ප්‍රමුඛයා ලෙස

නිරවුල්

බිමක් හිමි

සමාජයක්

බිහිකිරීම”

**දෙපාර්තමේන්තු මෙහෙවර**

"ජාතික ප්‍රතිපත්තියක් තුල

මනා සම්බන්ධීකරණයකින් යුතුව

සංවර්ධනයේ චිරස්ථායී බව සහතික කරමින්

රජයේ ඉඩම් ප්‍රශස්ථ මට්ටමින්

භාවිතා කිරීමට මඟ පෙන්වමින්

නිරවුල් බිමක අයිතිය තහවුරු කෙරෙන

විධිමත් කළමණාකාරීත්වයක්

පවත්වා ගෙන යෑම"

# අගයන්

1. පාරිභෝගිකයා ප්‍රමුඛ කොට සැලකීම
2. පාරිභෝගිකයාට පහසු වැඩ බිමක් සැකසීම
3. සාමූහික සහභාගීත්වය තුළින් කාර්යක්ෂම සේවාවක් ලබාදීම
4. තොරතුරු තාක්ෂණය තුළින් සේවාවේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම
5. තෘප්තිමත් සේවක පිරිස

## දෙපාර්තමේන්තුවේ අරමුණු හා උපාය මාර්ග

| අරමුණු | උපාය මාර්ග |
|---|---|
| 1 ඉඩම් නොමැති ප්‍රජාවගේ ඉඩම් භුක්තිය ශක්තිමත් කිරීම | i ඉඩම් හිමිකම තහවුරු කිරීම<br>ii රජයේ ඉඩම් පිළිබඳ විධිමත් දත්ත පද්ධතියක් පවත්වාගෙන යෑම |
| 2 ආයෝජන අවස්ථා පුළුල් කිරීම | i ආයෝජන අවස්ථා පුළුල් කිරීම සඳහා රජයේ ඉඩම් උපයෝජනය |
| 3 රජයේ ඉඩම් ප්‍රශස්ථ භාවිතය | i රජයේ ඉඩම් ප්‍රශස්ථ මට්ටමින් සංවර්ධනය කිරීම<br>ii රජයේ ඉඩම්වල ආරක්ෂාව තහවුරු කිරීම<br>iii රජයේ ඉඩම් ප්‍රශස්ථ භාවිතය |
| 4 දෙපාර්තමේන්තුව සතු සම්පත් ප්‍රශස්ථව කළමනාකරණය කිරීම | i මානව සම්පත සංවර්ධනය කිරීම<br>ii භෞතික සම්පත ඵලදායි ලෙස භාවිතා කිරීම<br>iii මූල්‍ය සම්පත විධිමත්ව කළමනාකරණය කිරීම |
| 5 රාජ්‍ය ආදායම වර්ධනය කිරීමට දායකවීම | i ඉඩම් ආදායම් හඳුනාගැනීම හා ඇස්තමේන්තු කිරීම<br>ii ඉඩම් ආදායම් කාර්යක්‍ෂමව හා විධිමත්ව රැස්කිරීම<br>iii හිඟ ආදායම් අයකර ගැනීම සඳහා නීත්‍යානුකූල පියවර ගැනීම |

පටුන | | පිටු අංක
---


**1. පරිච්ඡේදය - හැඳින්වීම** **15 - 21**

1.1 ඉඩම් පරිපාලනය තුළ ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

1.2 දෙපාර්තමේන්තුවේ විකාශය

1.3 2014 දී සිදු වූ වර්ධනය හා පසුබෑම

**2. පරිච්ඡේදය - ඉඩම් නොමැති ප්‍රජාවගේ ඉඩම් භුක්තිය ශක්තිමත් කිරීම** **22 - 39**

1.4 හැඳින්වීම

1.5 ඉඩම් බෙදාදීම

2.2.1 ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර ලබාදීම

2.2.2 රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීර්ඝ කාලීන බදුකර ලබාදීම

2.2.3 බිම්සවිය වැඩසටහන යටතේ ඉඩම් බෙදාදීම

2.3 දීමනාපත්‍ර නිකුත් කිරීම

2.3.1 ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර නිකුත් කිරීම

2.3.2 ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ මධ්‍යම පාන්තික දීමනාපත්‍ර ලබාදීම

2.3.3 නිදහස් දීමනාපත්‍ර ලබාදීම

2.3.4 පූජා භූමි දීමනාපත්‍ර ලබාදීම

2.3.5 සුනාමි දීමනාපත්‍ර ලබාදීම

2.3.6 ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ ඉඩම් බෙදා දීම (නියාදන සාධන පත්‍ර නිකුත් කිරීම)

2.3.7 ඉඩම් පැවරීම්, උකස් කිරීම් හා අතුරු බෙදීම්

2.4 උතුරු නැගෙනහිර පශ්චාත් යුධ සමයේ රජයේ ඉඩම් ගැටළු විසඳීමේ විශේෂ වැඩසටහන ( LLRC වාර්තාව අනුව)

2.4.1 වැඩසටහන පිළිබඳව ජනතාව දැනුවත් කිරීම

2.4.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම

2.5 ඉඩම් ගැටළු විසඳීම හා උපදෙස් සැපයීම

2.5.1 කොට්ඨාස දින පරීක්ෂණ

2.5.2 ජංගම සේවා පැවැත්වීම

2.5.3 අන්තර් පළාත් වාරිමාර්ග, ඉඩම් සංවර්ධන ව්‍යාපෘති සහ පළාත් සභා මට්ටමින් රජයේ ඉඩම් ගැටළු විසඳීමේ වැඩසටහන

2.6 රාජ්‍ය ඉඩම් තොරතුරු හා කළමණාකරන පද්ධතිය

2.6.1 හැඳින්වීම

2.6.2 රාජ්‍ය ඉඩම් කළමනාකරණ ක්‍රියාවලින් ප්‍රතිනිර්මාණය කිරීම

**2.6.3** රාජ්‍ය ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම

2.7 රජයේ ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත්ව ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගැනීම

2.7.1 ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත චක්‍රලේඛ නිකුත් කිරීම

**3. පරිච්ඡේදය - ආයෝජන අවස්ථා පුළුල් කිරීම සඳහා රජයේ ඉඩම් උපයෝජනය** **40 - 42**

3.1 හැඳින්වීම

3.2 ආයෝජන කටයුතු සඳහා ඉඩම් ලබාදීම

3.3 රජයේ ඉඩම් විදේශිකයින් සඳහා පැවරීම සීමා කිරීමේ නීතිය ක්‍රියාත්මක කිරීම

3.3.1 හැඳින්වීම

3.3.2 විදේශිකයින්ට රජයේ ඉඩම් පැවරීම සීමා කිරීමේ නීතිමය විධිවිධාන වල මූලිකාංග

3.3.3 ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම

**4. පරිච්ඡේදය - රජයේ ඉඩම් ප්‍රශස්ථ භාවිතය** **43 - 44**

4.1 හැඳින්වීම

4.2 රජයේ ඉඩම්වල ආරක්ෂාව තහවුරු කිරීම

4.3 පාරිසරික ප්‍රතිපත්ති හා නීති රීති ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා දායක වීම

4.3.1හැඳින්වීම

4.3.2 පාරිසරික ප්‍රතිපත්ති හා නීතිරීති ක්‍රියාත්මක කිරීම සඳහා දායක වූ වැඩසටහන්

**5. පරිච්ඡේදය - ආදායම් කළමනාකරණය කිරීම** **45 - 46**

5.1 හැඳින්වීම

5.2 ඉඩම් බදු ආදායම ඇස්තමේන්තු කිරීම හා රැස්කිරීම

**6. පරිච්ඡේදය - මානව සම්පත් කළමනාකරණය** **47 - 53**

6.1 හැඳින්වීම

6.1.1 කාර්ය මණ්ඩල සංයුතිය

6.1.2 ස්ථාන මාරුවීම්

6.1.3 විශ්‍රාම ගැනීම්

6.2 ආයතනික කටයුතු

6.2.1 උසස් කිරීම්

6.2.2 සේවක සුභසාධනය

6.3 මානව සම්පත් සංවර්ධනය

**7. පරිච්ඡේදය - භෞතික සම්පත් කළමනාකරණය** **54 - 57**

7.1 හැඳින්වීම

7.2 භෞතික සම්පත් භාවිතය හා සිදුවූ වෙනස්කම් සහ ප්‍රසම්පාදන කටයුතු, භාණ්ඩ අපහරණය

7.3 ගබඩා කළමනාකරණය

**8. පරිච්ඡේදය - මූල්‍ය කළමනාකරණය** **58 - 61**

8.1 හැඳින්වීම

8.2 අයවැය කළමනාකරණය

8.3 රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම

8.4 විගණන කටයුතු

# 1 පරිච්ඡේදය - හැඳින්වීම

## 1.1 ඉඩම් පරිපාලනය තුල ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

ඉඩම් කළමනාකරණයේ ප්‍රමුඛයා ලෙස ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව රජයේ ඉඩම් බැහැර කිරීමේදී සුවිශේෂී වූ කාර්යභාරයක් ඉටුකරනු ලබයි.

01. අන්තර් පළාත් වාරිමාර්ග හා ඉඩම් සංවර්ධන ව්‍යාපෘති කළමනාකරණය
02. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ජනාවාස යෝජනා ක්‍රම සැළසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා බෙදා දුන් ඉඩම් සඳහා දීමනාපත්‍ර නිකුත් කිරීම
03. රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉඩම් බෙදාදීම මේ යටතේ,
    - නිවාස,කෘෂිකාර්මික, කර්මාන්ත හා වාණිජ කටයුතු සඳහා දීර්ඝකාලීන බදුබලපත්‍ර යටතේ ඉඩම් ලබාදීම
    - විශේෂ හා නිදහස් දීමනාපත්‍ර නිකුත් කිරීම
    - විහාරස්ථාන සඳහා පූජා භූමි ඔප්පු නිකුත් කිරීම
    - රජයේ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල හා පළාත් පාලන ආයතන සඳහා අවශ්‍ය ඉඩම් නිදහස් කිරීම, බදු දීම හා පැවරීම
04. ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ ඉඩම් බෙදාදීම හා දීමනාපත්‍ර නිකුත් කිරීම
05. රජයේ ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යටතේ රජයේ ඉඩම් හා රක්ෂිත ආරක්ෂා කිරීම
06. ජනාවාස ව්‍යාපාරයන්හි යටිතල පහසුකම් සැපයීම
07. අන්තර් පළාත් ඉඩම් සංවර්ධන ව්‍යාපෘතිවලින් බැහැර රජයේ ඉඩම් පරිපාලනය සම්බන්ධයෙන් පළාත් ඉඩම් කොමසාරිස්වරුන්ට හා ප්‍රාදේශීය ලේකම්වරුන්ට අවශ්‍ය උපදෙස් හා මාර්ගෝපදේශ ලබා දීම
08. විවිධ සංවර්ධන කටයුතු හා සැලසුම් කටයුතු සඳහා ඉඩම් දත්ත ලබාදීම
09. රජයේ ඉඩම් කළමනාකරණ පද්ධතියක් පවත්වා ගෙනයාම
10. රාජ්‍ය බදු ආදායම් ශක්තිමත් කිරීමට බලපත්‍ර මත බදු අයකර ගැනීම කඩිනම් කිරීම
11. මානව සම්පත් සංවර්ධන කටයුතු පවත්වා ගෙනයාම
12. බිම් සවිය වැඩසටහන යටතේ රජයේ ඉඩම් සඳහා හිමිකම් සහතික පත්‍ර ලබාදීම
13. රජයේ ඉඩම්වල ආරක්ෂාව තහවුරු කිරීම
14. උතුරු නැගෙනහිර පළාත්වල ඉඩම් ගැටළු විසඳීම සඳහා LLRC නිර්දේශ ක්‍රියාත්මක කිරිම.
15 . ඉඩම් ආරවුල් නිරාකරණය කිරීම හා සමථකරණය

## 1.2 දෙපාර්තමේන්තුවේ විකාශය

ශ්‍රී ලංකාවේ පාලන බලය දීර්ඝ කාලයක් තුළ බ්‍රිතාන්‍ය ජාතීන් විසින් අල්ලා ගෙන තිබුණි. එම කාලය තුළ කඳුකරයේ ඉඩම්වල තේ වගාව ආරම්භ කිරීම, වියළි කලාපයේ වාරි පද්ධතිය කඩා වැටීම, ජනගහනය නිරිත දිග තෙත් කලාපයට කේන්ද්‍රවීම, වී වගාවට නිසි සැලකිල්ලක් නොලැබීම, ස්වයංපෝෂිත ආර්ථික රටාව වෙනුවට වාණිජ ආර්ථික රටාවට මුල් තැන දීම, පළමු ලෝක සංග්‍රාමයත් සමඟ ඇති වූ ආහාර හිඟය, ආදී ගැටළු රාශියකට මෙරට ජනතාවට මුහුණ දීමට සිදු විය. මෙම හේතූන් නිසාත් රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මෙරට නියෝජිතයින් මේ පිළිබඳ විශේෂ අවධානයක් යොමු කිරීම නිසාත් ආහාර නිෂ්පාදනය සඳහා කඩිනම් වැඩසටහනක අවශ්‍යතාව පැන නැගුණු නිසාත්, නිරිතදිග ප්‍රදේශයේ කේන්ද්‍රණය වූ ජනගහනය දිවයිනේ සෙසු ප්‍රදේශවල පදිංචි කිරීමේ අවශ්‍යතාවය පැන නැගී තිබූ නිසාත්, මේ සියල්ලට විසඳුම් සෙවීම සඳහා 1927 දී ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට ඉඩම් පිළිබඳ කොමිෂමක් පත් කරන ලදී. එම කොමිසමේ නිර්දේශ අනුව 1931 දී ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව පිහිටුවා ශ්‍රී ලංකාවේ ප්‍රථම ඉඩම් කොමසාරිස්වරයා ලෙස සී.වී බ්‍රේන් මහතා පත් කරන ලදී. ඒ අනුව රජය සතු ඉඩම්වල සියලු බලතල මෙම දෙපාර්තමේන්තුවට පැවැරුණි. මහ ගොවි ජනපද, උස් බිම් ව්‍යාපාරය, ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරය, තරුණ ව්‍යාපාරය, මධ්‍ය පන්තික ව්‍යාපාරය ලෙස විශේෂ සංවර්ධන වැඩසටහන් 05ක් හඳුනා ගැනීම, ඉඩම්ලාභීන් තෝරා ගැනීම, (ඉඩම් කච්චේරි පවත්වා) ඉඩම් බෙදාදීම, මෙහිදී ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට පැවරුණ ප්‍රධාන කාර්යයන් වේ. රජය සතු ඉඩම් හා පෞද්ගලික ඉඩම් වෙන්කර හඳුනා ගැනීමට 1931 දී "ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත" හඳුන්වා දුනි. 1935 දී "ඉඩම් සංවර්ධන ආඥාපනත" නීතිගත කර එම පනතට අනුව රජය සතු සියලුම ඉඩම්වල භාරකාරත්වය, බෙදාදීම හා සංවර්ධනය කිරීම, යන සියලු බලතලද ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට පැවරිණ.

විවිධ ආයතන හා පුද්ගලයින් සඳහා වාණිජමය කටයුතු හා පදිංචියට ඉඩම් ලබා දීම, විවිධ අවශ්‍යතාවයන් සඳහා රක්ෂිත ඉඩම් වෙන් කිරීම, වෙරළ, පොදු විල් හා දොළවල් ඇතුළුව රජයේ ඉඩම් පරිපාලනය පහසුව පිණිස 1947 දී "රජයේ ඉඩම් ආඥා පනත" හඳුන්වා දුන් අතර ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට එම බලතල ද පනතින් පැවරිණි.

"1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත"ට අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවක් පත් කර ගන්නා ලදි. මෙහිදී අක්කර 50ට වැඩි සියලු ඉඩම්වල අයිතිය කොමිෂමට පවරා ගන්නා ලදි. 1979 දී ස්ථාපිත "ඉඩම් ප්‍රධාන (විශේෂ විධිවිධාන) පනත"ට අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පවරා ගන්නා ලද ඉඩම් නැවත රජයට පවරා ගෙන මහජනතාවට බෙදාදීමේ කාර්යභාරයද ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට පැවරිණි.

රජය සතු ඉඩම් අනවසරයෙන් භුක්ති විඳින හෝ පදිංචිව සිටින පුද්ගලයින් එකී ඉඩම්වලින් ඉවත් කර සන්තකය නැවත රජයට ලබා ගැනීම පිණිස 1979 දී "රජයේ ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීමේ පනත" හඳුන්වා දී එම කාර්යභාරයද ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට පැවරිණි. 1978

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ 11 වැනි උපලේඛනයට යටත්ව ඉඩම් පිළිබඳව විෂය කටයුතුවලින් කොටසක් පළාත් සභාවට පැවරිණි. එම සංශෝධනයට අනුව අන්තර් පළාත් සංවර්ධන යෝජනා ක්‍රම ආශ්‍රිත ඉඩම්වල පරිපාලනය ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ කාර්ය යටතට පැවරිණි. අන්තර් පළාත් යටතට ගැනෙන අනුරාධපුරය, පුත්තලම, කුරුණෑගල, මන්නාරම, වව්නියා, ත්‍රිකුණාමලය, පොළොන්නරුව, මාතලේ, මහනුවර, බදුල්ල, අම්පාර, මඩකළපුව, මොණරාගල, හම්බන්තොට හා රත්නපුර යන දිස්ත්‍රික්ක ආශ්‍රීතව අනුරාධපුර කලාප 01, අනුරාධපුර කලාප 02, පොළොන්නරුව කලාපය, මහියංගන කලාපය, දෙබරවැව කලාපය, අම්පාර කලාපය ලෙස කලාප හයකට බෙදා පාලන කටයුතු කෙරිණි. මෙම පාලන කටයුතු පහසු කිරීම පිණිස නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්, සහකාර ඉඩම් කොමසාරිස්, ජනපද නිලධාරී, ක්ෂේත්‍ර උපදේශක වැනි නිලධාරීන් පත් කරන ලදී.

2004.09.03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව 2004.09.15 දින සිට මෙතෙක් ක්‍රියාත්මකව පැවති ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, "ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව" ලෙස උසස් කරන ලදී. ඒ අනුව මෙතෙක් ඉඩම් කොමසාරිස්ට තිබූ බලතල "ඉඩම් කොමසාරිස් ජනරාල්" ට පැවරිණි.

**දෙපාර්තමේන්තු විකාශය**

↓

1927 ඉඩම් කොමිසම පිහිටුවීම

↓

1931 ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව පිහිටුවීම

↓

1931 ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත සම්මත කිරීම

↓

1935 ඉඩම් සංවර්ධන ආඥා පනත සම්මත කිරීම

↓

1947 රජයේ ඉඩම් ආඥා පනත සම්මත කිරීම

↓

1972 අංක 1 ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත සම්මත කිරීම

↓

1979 ඉඩම් ප්‍රධාන (විශේෂ විධිවිධාන) පනත සම්මත කිරීම

↓

1979 රජයේ ඉඩම් සන්තකය ආපසු ගැනීමේ පනත සම්මත කිරීම

↓

1978 13 ආ. ව්‍යා. සංශෝධනයට අනුව ඉඩම් බලතල කොටසක් පළාත් සභාවට පැවැරීම

↓

2004.09.15 දින ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව ස්ථාපිත වීම

## 1.3 2014 දී සිදු වූ වර්ධනයන් හා පසුබෑම්

### i. හැඳින්වීම

2014 වර්ෂයේ ආරම්භය වන විට කාලයක් තිස්සේ දෙපාර්තමේන්තුව තුළ පැවති කාර්ය මණ්ඩල පුරප්පාඩු සැලකිය යුතු සංඛ්‍යාවක් පුරවා තිබුණි. උපාධිධාරීන් රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ වැඩසටහන යටතේ නව තනතුරු 200 ක් දෙපාර්තමේන්තුව තුළ ඇති කර තිබූ අතර ඉන් අඩකට වැඩි සංඛ්‍යාවක් සම්පූර්ණ කර ගැනීමට හැකිව තිබුණි. තවද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරු පුරප්පාඩු බොහෝමයක් අළුතින් බඳවා ගත් කණ්ඩායම් වලින් සම්පූර්ණ කර ගැනීමට හැකිවිය. එමෙන්ම ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරද පිරවීමට හැකි විය. දෙපාර්තමේන්තුවේ කාර්ය වැඩිවීම කෙරෙහි මෙම තත්ත්වය බලපෑ බව කිව යුතුය. එහෙත් දෙපාර්තමේන්තු මට්ටමින් පාලනය කළ නොහැකි හේතූන් මත යම් යම් අංශවල ප්‍රගතිය අඩු වීමෙන් එවැනි අංශ කිසියම් පසුබෑමකට ලක්වූ බවද කිව යුතුය.

### ii. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ විශේෂ වැඩසටහනේ සාර්ථකත්වය

2013 ජනවාරි සිට ක්‍රියාවට නංවන ලද උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කරමින් උතුරු හා නැගෙනහිර පළාත් වල පශ්චාත් යුධ සමයේ රජයේ ඉඩම් ගැටළු විසඳීමේ විශේෂ වැඩසටහන යටතේ 2013 වර්ෂයට වඩා ඉහළ ප්‍රගතියක් 2014 වර්ෂයේදී අත්කර ගත හැකි විය. ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් වූ කමිටුවක් මගින් මෙම කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ජාතික සැලැස්ම පිළිබඳව පසු විපරම් කරනු ලැබේ. එම පසු විපරම් සාකච්ඡා වලදී අනෙකුත් අමාත්‍යාංශ මගින් මෙම කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය හා සාපේක්ෂව සලකා බලන විට මෙම දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහනේ ප්‍රගතිය ඉතා ඉහළ මට්ටමක පවතින බවට ඇගයීමට ලක්වී ඇත. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා එම පළාත් දෙකෙහි ඉඩම් කොමසාරිස්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරු මෙන්ම මෙම වැඩසටහන සඳහා විශේෂ කොන්ත්‍රාත් පදනම මත පත්කරන ලද සහකාර ඉඩම් කොමසාරිස්වරුන් ගෙන්ද සුවිශේෂී සහයෝගයක් ලැබුණු බව කිව යුතුය. එම පළාත් වල රජයේ හා ත්‍රිවිධ හමුදාවල අවශ්‍යතාවයන් සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේදී පළාත් සභා හා වෙනත් ප්‍රාදේශීය දේශපාලන අධිකාරි වල බලපෑම් නිලධාරීන්ට එල්ලවීම හේතුවෙන් යම් යම් ගැටළු ඇති වූවද ඉහත සඳහන් මහජනතාවගේ රජයේ ඉඩම් ගැටළු විසඳීමේ වැඩසටහන කෙරෙහි එවැනි ඍණාත්මක ප්‍රතිවිරෝධයක් 2013 වර්ෂයෙන් පසුව ඇති නොවීම විශේෂත්වයකි. මෙම වර්ෂය තුළදී උතුරු හා නැගෙනහිර පළාත් වල ඉඩම් කැබලි 27,172 ක් සඳහා බලපත නිකුත් කිරීමට හැකිවීමද විශේෂත්වයකි. ඉතිහාසයේ ප්‍රථම වතාවට එක් ස්ථානයකදී බලපත්‍ර 20,000 ක් මහජනයා අතට උත්සවාකාරයෙන් ලබාදීම ද සුවිශේෂී සංධිස්ථානයකි.

### iii. ඉඩම් කැබලි ලක්ෂයක් බෙදාදීමේ දෙවන අදියර සම්පූර්ණ කිරීම

2005 වර්ෂයේ සිට ක්‍රියාත්මක වූ ඉඩම් කැබලි ලක්ෂයක් බෙදාදීමේ ජාතික වැඩසටහනෙහි පළමු අදියර අවසන් කර 2009 වර්ෂයේ අගෝස්තු මස සිට එහි දෙවන අදියර වශයෙන් තවත් ඉඩම් කැබලි ලක්ෂයක් බෙදාදීමේ කාර්යය ආරම්භ කළ අතර 2014 වර්ෂය අවසන් වන විට ඉඩම් කැබලි 129,769 ක් මහජනයා අතර බෙදා දී බලපත්‍ර නිකුත් කිරීමට හැකිවිය.

### iv. රජයේ ඉඩම් තොරතුරු හා කළමනාකරණ පද්ධතිය ක්‍රියාවට නැංවීම

රජයේ ඉඩම් පරිපාලනයේ දිගු කාලයක් තිස්සේ පැවති අකාර්යක්ෂමතාවය හා සේවා සැපයීමේ ප්‍රමාදයට සාර්ථක පිළියමක් වශයෙන් වසර කිහිපයක් තිස්සේ සැලසුම් කරමින් දරන ලද උත්සහයේ ප්‍රතිඵලයක් වශයෙන් රජයේ ඉඩම් තොරතුරු හා කළමනකරණ පද්ධතිය එළි දැක්වීමට හැකිවිය. එහි ප්‍රථම අදියර වශයෙන් ඉඩම් තොරතුරු ඉදිරිපත් කිරීම හා ඉඩම් බෙදාදීමේ හා ලියකියවිලි නිකුත් කිරීමේ ක්‍රියාවලීන් සඳහා සකස් කළ මෘදුකාංගය සාර්ථක ලෙස ක්‍රියාවට නැංවීමට මෙම වර්ෂයේදී හැකිවිය. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 68 ක නිලධාරීන් පුහුණු කර ක්‍රියාත්මක කිරීම සිදුවිය.

### v. නව තනතුරු ඇති කිරීම

දෙපාර්තමේන්තුව තුළ කාලයක් තිස්සේ පැවති අඩුපාඩුවක් සමනය කරමින් පාලන අංශය සඳහා ඉඩම් කොමසාරිස් තනතුරක් හා ගිණුම් අංශය සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරක්ද අලුතින් ඇතිකිරීමට හැකිවිය. තවද නීති අංශය පුළුල් කිරීමේ අපේක්ෂාවෙන් ඒ සඳහා වෙනම අංශයක් ඇති කර ඉඩම් කොමසාරිස් (නීති) නමින් නව තනතුරක් ද ඇති කිරීමට හැකි විය.

### vi. ඵලදායිතා වර්ධන කටයුතු ඇගයීමට ලක්වීම

2014 වර්ෂයේදී 2013 වර්ෂය සඳහා ජාතික ඵලදායිතා සම්මාන දෙපාර්තමේන්තු අතර තරඟය සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව ඉදිරිපත් විය. ඒ සඳහා ඵළදායිතා මෙහෙයුම් ඒකකයක් ආරම්භකර සම්බන්ධීකරණය සඳහා සහකාර ඉඩම් කොමසාරිස්වරියක්ද පත්කරන ලදී. එම තරගය ඉලක්ක කොට ගෙන ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් තුලින් විශේෂයෙන්ම පංචවිධ (5S ) සංකල්පය ඉහල මට්ටමකින් ක්‍රියාත්මක කිරීමට හැකි විය. මෙම තරගයෙන් විශේෂ කුසලතා සම්මානයක් දිනාගැනීමට දෙපාර්තමේන්තුව සමත් විය.

### vii. ද්‍රවිඩ භාෂාවෙන් කටයුතු කිරීමේ දී ඇතිවන ප්‍රමාදයන්

විශේෂයෙන්ම පශ්චාත් යුධ සමයෙන් පසුව උතුරු හා නැගෙනහිර පළාත්වල ඉඩම් ගැටළු විශාල ප්‍රමාණයක් විසඳීමේ කටයුතු වල මෙම දෙපාර්තමේන්තුව නියැලී සිටී. දෙපාර්තමේන්තුව වෙත ඒ අනුව ඉදිරිපත්වන අයදුම්පත්, ලිපිලේඛණ, අභියාචණා ආදිය අතුරින් ඉතා ඉහළ ප්‍රතිශතයක් ද්‍රවිඩ භාෂාවෙන් ඉදිරිපත් වේ. එහෙත් ද්‍රවිඩ භාෂාවෙන් රාජකාරි කටයුතු කිරීමට දැනුම සහිත නිලධාරීන්

දෙපාර්තමේන්තුව තුල සිටින්නේ ඉතාමත් අතලොස්සකි. ඉඩම් විෂයට අදාළව දෙමළ භාෂාවෙන් කටයුතු කරන මාණ්ඩලික නිලධාරීන් සිටින්නේ එක් අයෙකු පමණි. කළමනාකරණ සහකාර එක් නිලධාරිනියක් පමණක් සිටී. දෙමළ භාෂා පරිවර්තක තනතුරක් තිබුණද දිගු කාලයක් තිස්සේ එහි පුරප්පාඩුව පිරවීමට නොහැකි වී ඇත. මෙම තත්ත්වය යටතේ භාෂා පරිවර්තන කටයුතු සඳහා එදිනෙදා ලියකියවිලි විශාල සංඛ්‍යාවක් භාහිර භාෂා පරිවර්තකයන් ලවා ඉටු කර ගන්නා අතර එහිදී අනවශ්‍ය ප්‍රමාදයන් ඇතිවීම පාලනය කර ගත නොහැකිව ඇත.

# 2 පරිච්ඡේදය - ඉඩම් නොමැති ප්‍රජාවගේ ඉඩම් භුක්තිය ශක්තිමත් කිරීම

## 2.1 හැඳින්වීම


අංක 2008/04 චක්‍රලේඛය අනුව ඉඩම් නොමැති තැනැත්තන් හඳුනාගෙන ලියාපදිංචි කිරීමේ වැඩ පිළිවෙලක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් අරඹන ලදී. එසේ ලියාපදිංචි වූ පුද්ගලයින්ගෙන් බහුතරය කාලයක් තිස්සේ රජයේ ඉඩම් වල අනවසරයෙන් පදිංචිව සිටින, එහෙත් ඉඩම් අයිතියක් නොතිබූ පුද්ගලයින්ය. එසේ අනවසරයෙන් භුක්ති විඳින ඉඩම් සහ බෙදා දීමට සුදුසු යැයි හඳුනාගනු ලබන ඉඩම්, ඉඩම් නොමැති පුද්ගලයින් හට බෙදාදීම සඳහා විශේෂ වැඩසටහනක් ලෙස ඉඩම් කැබැළි ලක්ෂයක් බෙදදීමේ වැඩසටහන ආරම්භ කර 2009 වර්ෂයේ දී එම ඉලක්කය සම්පූර්ණ කර ගන්නා ලදී. එහි දෙවන අදියර යටතේ තවත් ඉඩම් කැබලි ලක්ෂය ඉක්මවූ ප්‍රමාණයක් 2014 වර්ෂය වන විට ජනතාවට බෙදා දෙන ලදී. ඉන් අනතුරුව මෙම වැඩසටහන ඉඩම් නොමැති පුද්ගලයින් සඳහා ඉඩම් ලබාදීමේ විශේෂ වැඩසටහන ලෙස අඛණ්ඩව පවත්වා ගෙන යනු ලැබේ.

## 2.2 ඉඩම් බෙදාදීම

ඉඩම් බෙදාදීම ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ශ්‍රී ලාංකික, අඩු ආදායම්ලාභී, ගොවි පන්තියේ අයට ප්‍රමුඛත්වය ලැබෙන පරිදි නේවාසික හා කෘෂිකාර්මික කටයුතු සඳහා බලපත්‍ර ලබාදීම සහ රජයේ ඉඩම් ආඥා පනත යටතේ කෘෂිකාර්මික, නේවාසික, කාර්මික, වාණිජමය අවශ්‍යතාවයන් සඳහා වැඩි ආදායම් ලාභීන් හා නාගරික ප්‍රදේශවල ජීවත්වන පුද්ගලයින් සහ ආයතන වලට ඉඩම් ලබා දීම මෙහිදී සිදු කරනු ඇත.

### 2.2.1 ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර ලබාදීම

මේ යටතේ 2006 වර්ෂයේ ජනවාරි සිට 2009 වර්ෂය දක්වා බලපත්‍ර ලක්ෂයක්ද එතැන් සිට 2014 වසර අවසන දක්වා තවත් ඉඩම් බලපත්‍ර 129,769 ක් බෙදා දීමට හැකි වී ඇත.




2014 වර්ෂය තුල ඉඩම් නොමැති පුද්ගලයින් සඳහා ඉඩම් බලපත්‍ර ලබාදීම යටතේ, බලපත්‍ර 25,000ක් ලබාදීමට ඉලක්ක කර බලපත්‍ර 42,781ක් ලබා දීමට හැකි වුණි. මෙම තත්වය පෙර වර්ෂයට සාපේක්ෂව14.2% ක අඩුවීමක් පෙන්නුම් කලද 2012 වර්ෂයට වඩා දෙගුණයක වර්ධනයකි. බලපත්‍ර ලාභීන් තෝරා ගැනීමේ ක්‍රමවේදයේදී ඉඩම් කච්චේරි පැවැත්වීම සමහර පළාත් සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වලින් ලැබුණු සහයෝගය අඩුකමත්, නිලධාරී හිඟයත් ප්‍රවර්තන වර්ෂය තුල පෙර වර්ෂයට සාපේක්ෂව පසු බැමට හේතු වූ සාධකයන් විය.

### 2.2.2 රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීර්ඝ කාලීන බදුකර ලබාදීම

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මඟින් කෘෂිකාර්මික, නේවාසික, කාර්මික, වාණිජමය අවශ්‍යතාවයන් සඳහා රජයේ හා පුද්ගලික අංශයේ ආයතන වලට සහ පුද්ගලයින්ට මෙන්ම විශේෂ සංවර්ධන ව්‍යාපෘති සඳහා ආයෝජනවල නියැලීමට අපේක්ෂා කරන ආයෝජකයන් හට ඉඩම් ලබා දීම සිදු කරයි. 1995 වර්ෂයේ සිට මේ දක්වා දීර්ඝ කාලීන බදුකර 19,743ක් ලබා දීමට හැකි විය. රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීර්ඝ කාලීන බදු බලපත්‍ර හෝ දීමනාපත්‍ර නිකුත් කිරීම සඳහා 1995. 06.15 දිනට පෙර සිට භුක්ති විඳි අනවසර කරුවන් තෝරා ගැනීමට ඉඩ ලබා දී තිබුණි. 2008 වර්ෂයේදී මෙම ක්‍රමය අත්හිටවූ අතර මේ සඳහා සාධාරණ කාලයක් ලබා දී තිබූ නිසා 2010 වර්ෂයෙන් පසුව තව දුරටත් අනවසර පදනම මත ඉඩම් ලබා දීම නැවැත්වීමට තීරණය කරන ලදී. ඒ අනුව අනවසරයෙන් භුක්ති විඳින ලද ඉඩම්ද ඉඩම් කච්චේරි ක්‍රමය තුලින්ම තෝරා ගත යුතු බවට උපදෙස් නිකුත් කරන ලදී. මෙම ක්‍රියාවලියේ පැවැති අඩුපාඩු හේතුවෙන් බදු අනුමැතිය සඳහා දිගු කාලයක් ගතවූ හෙයින් 2014 වර්ෂයේදීද දීර්ඝ කාලීන බදු බලපත්‍ර සඳහා ලබාදෙන අදාල ඉලක්කය අඩුකරන ලදී.

දීර්ඝ කාලීන බදුකර නිකුත් කිරීමේ ක්‍රියාවලිය ඉතා දීර්ඝ එකකි. එමගින් ප්‍රාදේශීය ලේකම්වරුන් සියළුම ඉඩම් කොමසාරිස් / නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) හරහා නිර්දේශ වාර්තා සමඟ සියළුම ලියකියවිලි එවනු ලැබේ. ඒවා පරීක්ෂාකර ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් මඟින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර බදු දීමට අනුමැතිය ලබාගත යුතුය. විරෝධතා සඳහා ගැසට් පත්‍රයේ එළකර නියමිත කාලයෙන් පසුව බදු අය කර භුක්තිය භාරදීම සිදුකෙරේ. ඉන් අනතුරුව රේඛා චිත්‍ර ලබා ගෙන බදුකර සකස් කර ඉඩම් අමාත්‍යාංශය හරහා ජනාධිපති ලේකම් කර්යාල වෙත යවා බදුකර අත්සන් කරවා ගෙන ප්‍රාදේශීය ලේකම් මඟින් ලියාපදිංචියට යවා ලියාපදිංචි කර බදුකර නිකුත් කෙරේ.





2014 වර්ෂය සඳහා දීර්ඝ කාලීන බදු බලපත්‍ර ලබාදීම යටතේ, අමාත්‍යාංශයට නිර්දේශ ලබාදීමේ ඉලක්කය 3500ක් වූ අතර බලපත්‍ර 3783ක් සඳහා අමාත්‍යාංශයට නිර්දේශ යවා ඇත. ඉඩම් භුක්තිය සඳහා විධිමත්ව භාරදීම යටතේ ඉලක්කය 1000ක් වූ අතර දීර්ඝ කාලීන බලපත්‍ර 1054ක් විධිමත්ව භුක්තිය භාර දී ඇත. දීර්ඝ කාලීන බදුකර නිකුත් කිරීම යටතේ ඉලක්කය 500ක් වූ අතර බලපත්‍ර 654ක් නිකුත් කිරීමට හැකියාව ලැබුණි. මෙම තත්වයන් පෙර වර්ෂයට සාපේක්ෂ වර්ධනයකි. එහෙත් දිගුකාලීන බදුදීම් අනුමැතිය සඳහා අමාත්‍යවරයා වෙත නිර්දේශ කරන ලද ඉල්ලීම් ප්‍රමාණය සහ අනුමැතිය ලබාදෙනු ලබන ප්‍රමාණය අතර වෙනස වර්ධනය වීමක් 2014 වර්ෂයේදී දැකිය හැකි විය. මේ නිසා භුක්තිය භාරදීම් සහ බදුකර නිකුත් කිරීම් ප්‍රගතිය අඩු වී ඇත.

## 2.2.3 බිම්සවිය වැඩසටහන යටතේ ඉඩම් බෙදාදීම

බිම්සවිය වැඩසටහන ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය හා හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ මූලික දායකත්වයෙන් ක්‍රියාවට නන් වන ලද ඉඩම් සඳහා හිමිකම් ලබා දීමේ ජාතික වැඩසටහන ලෙස හඳුන්වා දිය හැකිය. මෙම වැඩසටහන 2008 වර්ෂයේ සිට ජාතික වැඩසටහනක් ලෙස ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ සහ ඒ යටතේ ඇති ආයතන කිහිපයක සහ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දායකත්වය සපයමින් ක්‍රියාවට නැගුණි. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2014 වර්ෂය තුළද රජයේ ඉඩම් ගැටළුවලට විසඳුම් ලබා දීම සඳහා වැඩසටහන ක්‍රියාත්මක වූ අතර, එම වැඩසටහන පළාත් ඉඩම් කොමසාරිස්වරුන් ප්‍රාදේශීය ලේකම්වරුන් සහ අන්තර් පළාත් නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්වරුන්ගේ සහාය ලබාගෙන ක්‍රියාත්මක කරන ලදී. මේ අනුව රජයේ ඉඩම් සඳහා මෙම වැඩසටහන යටතේ 2014 වර්ෂය අවසන දක්වා බලපත්‍ර 106,847 ක් (මෙතෙක්) නිකුත් කිරීමට හැකියාව ලැබී ඇත. දීමනා පත්‍ර 32,441ක් සහ දීර්ඝ කාලීන බලපත්‍ර 19,550ක් ද මීට අමතරව මෙම වැඩ සටහන තුළින් ජනතාව අතර බෙදා දී ඇත.

බිම් සවිය වැඩ සටහන

බලපත්‍ර දීමනා පත්‍ර ලබාදීම - 2011 - 2014





2014 වර්ෂය සඳහා බිම්සවිය වැඩසටහන යටතේ බලපත්‍ර ලබාදීමේ ඉලක්කය 30,000ක් වූ අතර බලපත්‍ර 39,739ක් නිකුත් කිරීමට හැකියාව ලැබුණි. මෙම තත්වය පෙර වර්ෂයට සාපේක්ෂව 27.8% වර්ධනයකි. එමෙන්ම දීමනා පත්‍ර 4989 ක්ද දීර්ඝ කාලීන බදුකර නිර්දේශ 2897ක්ද ලබාදී ඇත. පෙර වර්ෂයේ සමස්ත ප්‍රගතිය 51,042ක් වූ අතර මෙම වර්ෂයේ සමස්ත ප්‍රගතිය 48,797ක් විය. මෙහි දක්වා ඇත්තේ ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර, දීමනාපත්‍ර, දීර්ඝ කාලීන බදුකර පමණි. ඊට අමතරව පූජාභූමි දීමනාපත්‍ර, සුනාමි දීමනාපත්‍ර, නිදහස් දීමනාපත්‍ර, පැවැරුම් නියෝග, නියාදන සාධනපත්‍ර, සමස්ත ප්‍රගතියට ඇතුළත් වේ. එහි අගයන් කුඩා බැවින් ප්‍රධාන වර්ග පමණක් ඉහත සංඛ්‍යාවට ඇතුලත් කර ඇත.

## 2.3 දීමනාපත්‍ර නිකුත් කිරීම

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් පළාත් සභා වෙත රජයේ ඉඩම් කළමනාකාරිත්වය සම්බන්ධව යම් පරිපාලන බලතල ලබාදී තිබුණද රජයේ ඉඩම්වල අයිතිය බැහැර කිරීමේ ජනාධිපතිවරයා සතු නීතිමය බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට සුවිශේෂී කාර්යභාරයක් පැවරී ඇත. රජයේ ඉඩම්වල අයිතිය බැහැර කිරීමේදී ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ රන්බිම දීමනා පත්‍ර නිකුත් කිරීම, රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීමනා පත්‍ර නිකුත් කිරීම, නිදහස් දීමනා පත්‍ර නිකුත් කිරීම සහ විශේෂ දීමනා පත්‍ර නිකුත් කිරීම, පූජාභූමි දීමනා පත්‍ර නිකුත් කිරීම, සුනාමි දීමනා පත්‍ර නිකුත් කිරීම හා ඉඩම් ප්‍රදාන (විශේෂ විධි විධාන) පනත යටතේ නියාදන සාධන පත්‍ර නිකුත් කිරීම ප්‍රධාන තැනක් ගනී.

## 2.3.1 ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර නිකුත් කිරීම

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර නිකුත් කර ඇති ඉඩම් සංවර්ධනය කළ පසුව ස්ථිර අයිතියක් ලබාදීම සඳහා කොන්දේසි වලට යටත්ව රන්බිම දීමනාපත්‍ර නිකුත් කිරීම මෙම දෙපාර්තමේන්තුවේ සංවර්ධන අංශය මගින් මෙහෙයවන ප්‍රධාන වැඩසටහනකි. ඒ සඳහා එම අංශයේ රන්බිම ඒකකය සක්‍රීය දායකත්වය සපයනු ලැබේ. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බෙදා දී ඇති රජයේ ඉඩම් සඳහා දීමනාපත්‍ර නිකුත් කිරීමේ සංවිධානාත්මක වැඩසටහනක් 1982 දී ආරම්භකළ අතර, 2002 ආරම්භ වන විට ස්වර්ණභූමි දීමනා පත්‍ර 324,203ක් ද, ජයභූමි දීමනාපත්‍ර 672,955ක් ද වශයෙන් දීමනාපත්‍ර 997,158ක් ඉඩම් කට්ටිකරුවන්ට ලබාදී තිබුණි. මෙම දීමනා පත්‍ර කොන්දේසි සහිතව සකස් කොට තිබූ අතර, ස්වර්ණභූමි දීමනාපත්‍ර වලට පමණක් රේඛා චිත්‍රයක් ඇතුලත්ව තිබූ අතර, ජයභූමි දීමනාපත්‍ර වැඩි ප්‍රමාණයක් සකස් කොට තිබුණේ මැණුම් රේඛා චිත්‍රයක් නොමැතිව ඉඩමේ හතර මායිම් පමණක් ඇතුලත් කරමිණි. මෙම අඩුපාඩුව සැලකිල්ලට ගෙන කොන්දේසි රහිතව රේඛා චිත්‍රයක් ද ඇතුළත් කොට දීමනා පත්‍ර නිකුත් කිරීමේ අරමුණින් ඉඩම් සංවර්ධන ආඥාපනත සංශෝධනය කිරීමේ කටයුතු 2002 වර්ෂයේදී ආරම්භ කර 2003 වර්ෂයේදී සංශෝධිත පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදි. ඒ හේතුව නිසා 2002, 2003 වර්ෂවල දීමනා පත්‍ර නිකුත් කිරීමේ කටයුතු තාවකාලිකව නවතා තිබුණි. එහෙත් සංශෝධිත පනත් කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක් මත නැවත සංශෝධනය සඳහා ඉවත්කර ගැනීමට සිදුවිය. ඉන්පසු දීමනාපත්‍ර නිකුත් කිරීමේ කටයුතු සාමාන්‍ය පරිදි 2004 වර්ෂයෙහි නැවත ආරම්භ කර ඇත. ඒ අනුව 2004 සිට 2014 වසර අවසන් වන විට දීමනා පත්‍ර 72,635 ක් නිකුත් කිරීමට හැකි වී ඇත.




2014 වර්ෂය තුළ රන්බිම දීමනා පත්‍ර 10,000 ක් නිකුත් කිරීමට සැළසුම් කළ අතර වසර අවසන් වන විට දීමනා පත්‍ර10,011 ක් නිකුත් කිරීමට හැකියාව ලැබී ඇත. මෙම තත්ත්වය පෙර වර්ෂයට සාපේක්ෂව 34% ක වර්ධනයකි.


## 2.3.2 ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ මධ්‍යම පාන්තික දීමනා පත්‍ර ලබා දීම

ඉඩම් සංවර්ධන ආඥා පනත මගින් සම්මත කර ඇත්තේ ඉඩම් අහිමි ගොවි පාන්තිකයින්ට පමණක් නොව යම් මූල්‍ය හෝ ප්‍රාග්ධන හැකියාවක් හිමි පුරවැසියන්ට ද රජයේ ඉඩම් කැබැල්ලක් ලබාදී එම ඉඩම් කැබැල්ල සංවර්ධනය කොට ජාතික නිෂ්පාදිතයට සක්‍රියව දායකකර ගැනීම සඳහා වන ක්‍රමවේදයක් සකස් කිරීමයි. ඒ අනුව මධ්‍යම පාන්තිකයින්ට රජයේ ඉඩම් කැබැල්ලක් ලබාදීම යටතේ එක් අයෙකුට අක්. 10, 25ක් හෝ අක්.50ක් වැනි විශාල බිම් ප්‍රමාණයක් ලබාදීම සිදුකරයි.

මධ්‍යම පාන්තික යෝජනා ක්‍රමය යටතේ ඉඩම් බහුලව පැවති ප්‍රදේශවල ඉඩම් මීට පෙර බෙදා දී ඇත. ඉන් සමහරකට සංවර්ධනය කළ පසුව දීමනාපත්‍ර ලබාදී ඇත. එහෙත් සමහර ඉඩම්වලට තවමත් දීමනාපත්‍ර ලබා දී නැත. දැනට පවතින ඉඩම් හිඟය නිසා ප්‍රතිපත්තියක් වශයෙන් මධ්‍යම පාන්තික යෝජනා ක්‍රමය යටතේ මෙවැනි විශාල ඉඩම් කොටස් බෙදාදීම සිදු නොකෙරේ. එහෙත් බලපත්‍ර සහිත බෙදාදී ඇති ඉඩම් වලට දීමනාපත්‍ර නිකුත් කිරීම අඛණ්ඩව සිදුකෙරේ.

දීමනාපත්‍ර ලබා දීමේදී, ඉඩම් සංවර්ධන ආඥා පනතේ ඇති වගන්තිවලට පටහැනිව අදාල දීමනාපත්‍රය බැහැරකර ඇත්නම් එම දීමනා පත්‍රය ඉඩම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු ලේඛණයේ ලියාපදිංචි කර තිබු මුත් අදාල ලේඛණයේ නිරවද්‍යතාවය පිළිබඳව සෑහීමකට පත් නොවන්නේ නම් එය බල රහිත කිරීමට ඉඩම් කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

මධ්‍යම පාන්තික දීමනා පත්‍ර ලබාදීම 2012 - 2014





2014 වසරේදී මධ්‍යම පාන්තික දීමනා පත්‍ර 45 ක් ලබා දීමට ඉලක්ක කොට තිබූ අතර, දීමනා පත්‍ර 24ක් ලබා දීමට හැකි විය.

මධ්‍යම පාන්තික බලපත්‍ර සහිත ඉඩම් සඳහා දීමනාපත්‍ර ලබා ගැනීමේදී ඉඩමේ සම්පූර්ණ වටිනාකම ගෙවිය යුතුය. එහෙත් බලපත්‍රයක් සහිතව ඉඩම භාවිතා කිරීමට බාධාවක් නැත. එහෙත් ඉඩම පැවැරීමට අවශ්‍ය වුවහොත් දීමනාපත්‍රයක් තිබිය යුතුය. මේ හේතුව නිසා බලපත්‍ර සහිත මධ්‍යම පාන්තික ඉඩම් සඳහා දීමනාපත්‍ර ලබා ගැනීමට කරනු ලබන ඉල්ලීම් ඉහළ යාමක් දැකිය නොහැක.

### 2.3.3 නිදහස් දීමනාපත්‍ර ලබා දීම


දීර්ඝ කාලීන බදුකර හෝ ප්‍රාරම්භක බදුකර සහිතව බෙදාදී ඇති ඉඩම් සඳහා ස්ථිර අයිතිය සහිත නිදහස් දීමනා පත්‍රයක් ලෙස මහජනතාවට භුක්ති විදීම සඳහා ලබාදීම මෙහිදී සිදු කරනු ලබයි. එහෙත් වාණිජ කටයුතු සඳහා මෙවැනි දීමනාපත්‍ර ලබා දෙනු නොලැබේ.




2014 වර්ෂය තුළ නිදහස් දීමනා පත්‍ර 250 ක් දීමට සැලසුම් කළ අතර වසර අවසන් වන විට දීමනා පත්‍ර 247 ක් නිකුත් කිරීමට හැකියාව ලැබී ඇත.

### 2.3.4 පූජා භූමි දීමනා පත්‍ර ලබා දීම

බෞද්ධ පූජනීය ස්ථානවල පැවැත්ම උදෙසා දීමනා පත්‍ර ලබාදීම, වර්ෂයක් පාසා සිදුකරනු ලබන කටයුත්තකි. ප්‍රවර්තන වර්ෂය තුලද එම කටයුතු සිදු වු ආකාරය පහතින් දක්වා ඇත. මේ දක්වා පූජා භූමි දීමනාපත්‍ර 1,618ක් ලබා දී ඇත.




2014 වර්ෂය තුළ පූජා භූමි දීමනා පත්‍ර 50 ක් දීමට සැලසුම් කළ අතර වසර අවසන් වන විට දීමනා පත්‍ර 88 ක් ලබාදීමට හැකියාව ලැබුණි. මෙම තත්ත්වය පෙර වර්ෂයට සාපේක්ෂව 76%ක වර්ධනයකි.

### 2.3.5 සුනාමි දීමනා පත්‍ර ලබා දීම


සුනාමි අවතැන්වූවන් සඳහා නොමිලේ නිදහස් දීමනාපත්‍ර ලබාදීම (විකල්ප ඉඩම් ලබාදීම) 2007 වර්ෂයේ සිට සිදු කරන ලද අතර, ඒ අනුව මේ දක්වා දීමනාපත්‍ර 5,060 ක් ලබා දී ඇත.

| විස්තරය | 2012 | 2013 | 2014 |
|---|---|---|---|
| ලබාදුන් දීමනාපත්‍ර සංඛ්‍යාව | 736 | 1004 | 689 |

2014 වර්ෂය තුළ සුනාමි දීමනා පත්‍ර 1000 ක් දීමට සැලසුම් කළ අතර වසර අවසන් වන විට දීමනා පත්‍ර 689 ක් ලබාදීමට හැකියාව ලැබුණි.

### 2.3.6 ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ ඉඩම් බෙදා දීම (නියාදන සාධන පත්‍ර නිකුත් කිරීම)


1979 වර්ෂයේ සිට මෙම පනත ක්‍රියාත්මකවේ. මෙම පනතට අනුව බෙදා දෙනු ලබන්නේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පවරා ගනු ලැබූ ඉඩම් වලින් ඉඩම් නොමැති පවුල් සඳහා බෙදා දීම පිණිස රජයට නිදහස් කරනු ලබන ඉඩම් වේ. කිසිදු ඉඩම් කැබැල්ලක අයිතියක් නොමැති දුප්පත් ජනතාව වෙත මේ යටතේ ඉඩම් ලබා දෙනු ඇත. 1979 වර්ෂයේ සිට මේ දක්වා බෙදා දී ඇති මුළු ඉඩම් සංඛ්‍යාව 77,903 ක් වේ. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ගෙන ඇති ප්‍රතිපත්තිමය තීරණයක් අනුව මෑතක සිට මෙම පනත යටතේ ඉඩම් නිදහස් නොකරන අතර ඉඩම් නොමැති පවුල් සඳහා බෙදාදීමට ඉඩම් ප්රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඵලදායී නොවන ඉඩම් හඳුනාගත් විට, ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ වන්දි ගෙවා ගම් පුළුල් කිරීමේ අරමුණින් අත්කර ගැනීමට පමණක් ඉඩ කඩ සලසා ඇත. මේ නිසා ඉඩම් ප්‍රධාන (විශේෂ විධිවිධාන) පනත යටතේ නව ඉඩම් බෙදාදීමක් සිදු නොවන අතර කලින් ආරම්භකළ මෙතෙක් කටයුතු අවසන් නොවූ ඉඩම් වල කටයුතු පමණක් සිදුවේ.




2014 වසරේ ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ නියාදන සාධන පත්‍ර 250 ක් නිකුත් කිරීමට සැලසුම් කර තිබූ අතර නියාදන සාධන පත්‍ර 285 නිකුත් කිරීමට හැකියාව ලැබී ඇත.

### 2.3.7 ඉඩම් පැවරීම්, උකස් කිරීම් හා අතුරු බෙදීම්

රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීර්ඝ කාලීන බදුකර මත නිකුත්කරන ලද ඉඩම් පැවරීම්, උකස් කිරීම් හා අතුරු බදුදීම් සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය ලබාගත යුතුය. ඒ අනුව 2014 වර්ෂය තුළ ඉඩම් පැවරීම්, උකස් කිරීම් හා අතුරු බදුදීම් සඳහා අනුමැතිය ලබාදී ඇති ආකාරය පහතින් දක්වා ඇත.




2014 වර්ෂය තුල ඉඩම් පැවරීම්, උකස් කිරීම් හා අතුරු බදුදීම් සඳහා අවසර ලබාදීම වසර අවසන් වන විට 119ක් විය. මෙම තත්ත්වය පෙර වර්ෂයට සාපේක්ෂ වර්ධනයකි.

## 2.4 උතුරු නැගෙනහිර පශ්චාත් යුධ සමයේ රජයේ ඉඩම් ගැටළු විසඳීමේ විශේෂ වැඩසටහන ( LLRC වාර්තාව අනුව)

උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්මේ ( LLRC වාර්තාව ) නිර්දේශ වලට අනුව, උතුරු හා නැගෙනහිර පළාත්වල පැවති ගැටුම්කාරී වාතාවරණය නිමවීමෙන් පසුව එම පළාත්වල ජනතාවගේ ජන ජීවිතය නඟා සිටුවීමේදී කඩිනමින් විසඳුම් ලබාදිය යුතු ගැටළුවක් ලෙස එම ප්‍රදේශවල පවත්නා ඉඩම් ගැටළු හඳුනාගෙන ඇත. ඒ අනුව මෙම ගැටළුවට ප්‍රමුඛත්වය ලබා දෙමින් එම ගැටළු කඩිනමින් විසඳීම සඳහා ඉඩම් අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව දිගු කලක සිට අයිතිය නොලද භුක්ති විදි ඉඩම් වලට අයිතිය ලබාදීම, නැවත පදිංචි කළ ඉඩම් වල අයිතිය ලබාදීම, යුධ සමයේ ක්‍රියාත්මක වූ වැරදි පරිපාලනය නිසා ඇතිවූ ඉඩම් ආරවුල් විසඳීම , අස්ථානගත වූ හෝ විනාශ වූ ඉඩම් ලියවිලි යථාවත් කිරීම මේ යටතේ සිදුකරනු ලැබුණි.

## 2.4.1 වැඩසටහන පිළිබඳව ජනතාව දැනුවත් කිරීම

LLRC වාර්තාවේ නිර්දේශ මෙම කරුණට අදාලව පහත සඳහන් පරිදි ක්‍රියාත්මක කර ඇත.

**චක්‍රලේඛ නිකුත් කිරීම**

| වැඩසටහනට අයත් LLRC නිර්දේශය | ක්‍රියාකාරකම් | ප්‍රගතිය |
|---|---|---|
| 9.104 යළි පදිංචි කර ඇති අවතැන් වූ අයට ඉඩමේ නීතිමය අයිතිය ප්‍රදානය කිරීම | හිමිකම ප්‍රදානය කිරීම බලාත්මක කරන චක්‍රලේඛ / වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | අංක 2013/01 නමින් නව චක්‍රලේඛයක් හඳුන්වා දීම සහ එහි ක්‍රියාකාරකම් බලාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම |

**විවිධ ක්‍රියාකාරකම් අනුගමනය කිරීම**

| වැඩසටහනට අයත් නිර්දේශය | ක්‍රියාකාරකම් | ප්‍රගතිය |
|---|---|---|
| 9.106 මහජනයාට යළි පදිංචි වීම සඳහා පවතින ප්‍රදේශ සම්බන්ධ ප්‍රතිපත්ති සහ පවතින විකල්ප පිළිබඳව අවශ්‍ය වූ අය අතර දැනුවත්භාවයක් ඇති කිරීම. | දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | මාධ්‍ය සාකච්ඡා පැවැත්වීම<br>පුවත්පත් දැන්වීම් පළ කිරීම<br>වෙබ් අඩවිවල පළ කිරීම<br>විදේශ රටවල ශ්‍රී ලංකා තානාපති කාර්යාල මඟින් ප්‍රචාරය කිරීම, අත් පත්‍රිකා මුද්‍රණය කිරීම. |

## 2.4.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම

| වැඩසටහනට අයත් LLRC නිර්දේශය | ක්‍රියාකාරකම් | ප්‍රගතිය |
|---|---|---|
| 9.124 (3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සලසා ඇති ප්‍රතිපාදන වලට අනුව රජයේ ඉඩම් බෙදා හැරීම කරගෙන යෑම සහතික කිරීම. | පනත්වල විධිවිධානයන් ක්‍රියාත්මක වීම සහතික කිරීම | ක්‍රියාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීම් පුහුණු වැඩසටහන් පැවැත්වීම |

2014 වර්ෂය තුල මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී එක් එක් අංශ අනුව ඉහළ ප්‍රගතියක් අත්කර ගැනීමට සමත්වී ඇත. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

- **පුහුණු වැඩසටහන් පැවැත්වීම - 2014**

| පළාත | පැවැත්වූ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | පුහුණුව නිමකල නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| උ.පළාත | 20 | 1750 |
| නැ.පළාත | 18 | 1295 |
| **එකතුව** | **38** | **3045** |

- **ඉඩම් කච්චේරි පැවැත්වීම - 2014**

| පළාත | පැවැත්වන ලද ඉඩම් කච්චේරි සංඛ්‍යාව | ලබාදුන් බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|
| උ.පළාත | 761 | 22617 |
| නැ. පළාත | 377 | 4555 |
| **එකතුව** | **1138** | **27172** |

**ඉඩම් හා සම්බන්ධ ගැටළු විසඳීම පිළිබද සමස්ත ප්‍රගතිය - 2014   උතුරු පළාත**

| ගැටලුව | 2013 | | 2014 තෙක් | |
|---|---|---|---|---|
| | ඉදිරිපත්වූ ගැටලු සංඛ්‍යාව | විසදා ඇති ගැටලු සංඛ්‍යාව | ඉදිරිපත්වූ ගැටලු සංඛ්‍යාව | විසදා ඇති ගැටලු සංඛ්‍යාව |
| ඉඩම් ඉල්ලීම් | 93,270 | 15,763 | 129,424 | 50,201 |
| ඉඩම් ලේඛන යාවත්කාලීන කිරීම් | 26,263 | 2,053 | 23.621 | 12,426 |
| වෙනත් | 24,348 | 4,252 | 27,387 | 15,195 |

**නැගෙනහිර පළාත**

| ගැටලුව | 2013 | | 2014 තෙක් | |
|---|---|---|---|---|
| | ඉදිරිපත්වූ ගැටලු සංඛ්‍යාව | විසදා ඇති ගැටලු සංඛ්‍යාව | ඉදිරිපත්වූ ගැටලු සංඛ්‍යාව | විසදා ඇති ගැටලු සංඛ්‍යාව |
| ඉඩම් ඉල්ලීම් | 2,790 | 418 | 5,449 | 904 |
| ඉඩම් ලේඛන යාවත්කාලීක කිරීම් | 5,358 | 418 | 8,204 | 1,988 |
| වෙනත් | 3,024 | 341 | 5,526 | 1,240 |
| **පළාත් දෙකෙහිම ප්‍රගතිය** | **155,053** | **23,245** | **199,641** | **81,954** |

2014 වර්ෂයේදී මෙම වැඩසටහන මගින් ඉඩම් ගැටලු 50,000ක් විසදීම සඳහ ඉලක්ක කර ගැටලු 58,709 ක් විසදීමට හැකියාව ලැබුණි. මෙම තත්ත්වය පෙර වර්ෂයට සාපේක්ෂ වර්ධනයකි.

මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරිම සඳහා LLRC වාර්තාව මගින් නිර්දේශ කර තිබූ පරිදි ප්‍රමාණවත් අතිරේක කාර්ය මණ්ඩලයක් සහ භෞතික පහසුකම් 2013 වර්ෂයේ ආරම්භයේ සිට අපේක්ෂා කළ නමුත් මූල්‍ය ප්‍රතිපාදන හැර අනෙකුත් සම්පත් (මානව සම්පත් හා වාහන) ලබාදීම දිගින් දිගටම ප්‍රමාද විය. මෙය දෙපාර්තමේන්තුවට හෝ අමාත්‍යාංශයට පාලනය කළ නොහැකි සාධකයක් විය. එම නිසා ඉදිරිපත් වූ සියළුම ගැටළු එම කාලපරිච්ඡේදය තුළදී විසදීමට නොහැකි වූ බැවින් පවත්නා සම්පත් අනුව වාර්ෂික ඉලක්ක නියම කරන ලදී. එම වාර්ෂික ඉලක්ක 2013 වර්ෂයේ සිටම සපුරාගැනීමට හැකි විය. ඒ අනුව ඉදිරිපත් වූ ගැටළු වලින් තව දුරටත් ඉතිරි වන ගැටළු විදීමට අපේක්ෂිත පරිදි 2013 හා 2014 වර්ෂ දෙකේදී පමණක් හැකියාව නොමැති වූ හෙයින් 2015 වර්ෂය සඳහා ද වැඩසටහන දීර්ඝ කිරීමට තීරණය කරන ලදී. තවද ලියාපදිංචි වූ ගැටළු සියල්ලම LLRC නිර්දේශ වලට ඍජුවම අදාල වූ ඉඩම් ගැටළු නොවන බව වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී පැහැදිලි විය. එහෙත් එසේ ඍජුවම අදාළ


නොවන ගැටළු වෙන් කිරීමට ප්‍රාදේශීය ලේකම්වරුන්ට උපදෙස් දෙනු ලැබුවද එය ප්‍රායෝගිකව අපහසු කාර්යයක් වූ හෙයින් මෙම ගැටළු සියල්ල එම ප්‍රදේශ වල ජනතාවගේ සංවේදී ගැටළු වන හෙයින්ද සියළුම ගැටළු විසඳීමට සිදුවිය. සෘජුවම මෙම වැඩසටහනට අදාල වූ ගැටළු, දළ වශයෙන් ඉදිරිපත් වූ ගැටළු වලින් 60%ක් පමණ වන බව හෙළි වී ඇත.

## 2.5 ඉඩම් ගැටළු විසඳීම හා උපදෙස් සැපයීම

ඉඩම් ලාභීන්ගේ ඉඩම් ගැටළු විසඳීම හා උපදෙස් සැපයීම කොට්ඨාස දින පැවැත්වීමේ වැඩසටහනත් ජංගම සේවා පැවැත්වීමේ වැඩසටහනත් ක්‍රියාත්මක කෙරුණි. මීට අමතරව අන්තර් පළාත් හා පළාත් සභා මට්ටමින් යොමුවන ඉඩම් ගැටළු වලට නීතිමය සහ තාක්ෂණික සහාය ලබා දීමද දෙපාර්තමේන්තුවම විසින් ලබාදෙයි.

### 2.5.1 කොට්ඨාස දින පරීක්ෂණ


ඉඩම් ලාභීන්ගේ ඉඩම් හිමිකම් ආශ්‍රිත පැන නැගී ඇති ගැටළු වලට ක්ෂේත්‍රය තුළදීම විසඳුම් ලබා දීම සඳහා කොට්ඨාස දින පරීක්ෂණ අන්තර් පළාත් මට්ටමින් පැවැත්වීම සිදු කරයි. පසුගිය වසර තුන තුල කොට්ඨාස දින පරීක්ෂණ පවත්වා ඇති ආකාරය පහත දැක්වේ




2014 වර්ෂය තුල අන්තර් පළාත් මට්ටමින් කොට්ඨාස දින පරීක්ෂණ 885 ක් පැවැත් වුණි. ඉන් ඉඩම් ගැටලු 9185ක් ඉදිරිපත් වූ අතර ගැටලු 7615ක් සඳහා කඩිනම් විසඳුම් ලබාදුණි. සෙසු ගැටළු සඳහා ද 2015 වර්ෂය තුලදී විසඳුම් ලබා දෙනු ඇත.

### 2.5.2 ජංගම සේවා පැවැත්වීම


ඉඩම් ලාභීන්ගේ ඉඩම් ආශ්‍රිතව පැනනැගී ඇති ගැටළුවලට රාජ්‍ය නිලධාරීන්ගේ මැදිහත්වී ප්‍රාදේශීය මට්ටමින් ඊට විසඳුම් ලබා දීමේ ක්‍රියාවලිය ජංගම සේවා වැඩසටහන ලෙස හැඳින්වේ. ඒ අනුව 2014 වර්ෂයේ දී ජංගම සේවා පැවැත් වූ, ඉදිරිපත් වූ ගැටළු සහ ඒවාට විසඳුම් ලබාදුන් ආකාරය පිළිබඳ තොරතුරු පහතින් පෙන්නුම් කර ඇත.




2014 වර්ෂය තුල අන්තර් පළාත් මට්ටමින් ජංගම සේවා වැඩසටහන් 40ක් පැවැත්වීමට සැලැසුම් කල අතර ජංගම සේවා වැඩසටහන් 75 ක් පැවැත්වීමට හැකි වුණි. ඉන් ඉඩම් ගැටළු 4165ක් ඉදිරිපත් වූ අතර ගැටළු 2347ක් සඳහා කඩිනම් විසඳුම් ලබාදුණි. ගැටළු 459ක් වෙනත් අංශ වෙත යොමුකල අතර සෙසු ගැටලු සඳහා ද තවදුරටත් අධ්‍යනයෙන් පසුව විසඳුම් ලබා දෙනු ඇත.

### 2.5.3 අන්තර් පළාත් වාරිමාර්ග, ඉඩම් සංවර්ධන ව්‍යාපෘති සහ පළාත් සභා මට්ටමින් රජයේ ඉඩම් ගැටළු විසඳීමේ වැඩසටහන

අන්තර් පළාත් හා පළාත් සභා සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදු කරනු ලබන ඉඩම් සංවර්ධන ව්‍යාපෘති සහ ඉඩම් කළමනාකරණ කටයුතුවලදී පාරිභෝගිකයා ගෙන් සෘජුවම හා වක්‍රව ලැබෙන ඉඩම් ගැටළු සඳහා නීතිමය හා තාක්ෂණ සහාය ලබා දෙමින් අදාල ගැටළුවලට විසඳුම් ලබා දීම, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් සිදු කරයි. 2014 වර්ෂය තුළ අදාල ගැටළු සම්බන්ධව ක්‍රියාකර ඇති ආකාරය පහත පරිදි වේ




මෙහි තවදුරටත් ක්‍රියා කිරීමට ඇති ගැටළු විසඳීම සම්බන්ධයෙන් වාර්තා කැඳවීම, ලිපි ගොණු හුවමාරුවීම්, පරීක්ෂණ පැවැත්වීම් ආදී ලෙස කටයුතු රාශියක් කළ යුතුව ඇති හෙයින් ඒ සඳහා වැඩි කාලයක් ගතවන බැවින්ද ඉදිරි කාලයේදී ඒ සඳහා විසඳුම් ලබාදෙනු ඇත.

## 2.6 රාජ්‍ය ඉඩම් තොරතුරු හා කළමණාකරන පද්ධතිය

### 2.6.1හැඳින්වීම

රජයේ ඉඩම් කළමනාකරණ කටයුතු කාර්යක්ෂම කරලීම සඳහා තොරතුරු තාක්ෂණය භාවිතා කරමින් රජයේ ඉඩම් තොරතුරු කළමණාකරණ පද්ධතිය State Land Information Management Systsem නිර්මාණය කිරීමට කටයුතු කර ඇත. රජයේ ඉඩම් පිළිබඳ තොරතුරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් මෙම පද්ධතියට ඇතුළත් කිරීමට කටයුතු සිදු කරන අතර ඉඩම් බෙදාදී ලියකියවිලි නිකුත් කිරීම හා ආදායම් රැස්කිරීමේ ක්‍රියාවලියද බෙදා දුන් ඉඩම් වලට අදාළ පසු කටයුතු හා අධීක්ෂණ කටයුතු ද මෙම පද්ධතිය මඟින් සිදු කිරීමට හැකියාව ඇත. 2013 වර්ෂයේ දී බස්නාහිර පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 40 ක සහ 2014 වර්ෂයේදී දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 101 ක මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබී ඇත.

### 2.6.2 රාජ්‍ය ඉඩම් කළමනාකරණ ක්‍රියාවලීන් ප්‍රතිනිර්මාණය කිරීම

මෙම පද්ධතිය නිර්මාණය කිරීම සඳහා ඉඩම් අමාත්‍යාංශය, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව, බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව හා මීගමුව, කඩුවෙල, වලල්ලාවිට යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධ විය.මෙම පද්ධතිය නිර්මාණය කිරීමේ මූලික කටයුතු 2008 වර්ෂයේදී ආරම්භ වූ අතර අඛණ්ඩව පවත්වන ලද වැඩ මුළු ගණනාවකින් පසුව තොරතුරු පද්ධතිය නිර්මාණය කිරීමට හැකි විය. ඒ අනුව තාක්ෂණ හා මූල්‍ය දායකත්වය ශ්‍රී ලංකා තොරතරු තාක්ෂණ නියෝජිත ආයතනය(ICTA) විසින් ලබා දෙන ලදී. රජයේ ඉඩම් කළමනාකරණයට අදාළ නීති රීති වෙනස් නොකරමින් පවත්නා ක්‍රියාවලින් පමණක් වෙනස් කිරීමට කටයුතු කල අතර එය රාජ්‍ය ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය කිරිමක් (Government Process Re-engineeing ) ලෙස සිදු කරන ලදී. මෙම ක්‍රියාවලීන් ප්‍රතිනිර්මාණය කිරීම යටතේ පහත සඳහන් ප්‍රධාන ක්‍රියාවලීන් නිර්මාණය කර ඇත.

ක්‍රියාවලිය A - රජයේ ඉඩම් හඳුනා ගැනීම හා බැහැර කිරීමේ ක්‍රියාවලිය

ක්‍රියාවලිය B - බැහැරකරන ලද රජයේ ඉඩම් අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලිය

ක්‍රියාවලිය C - බැහැරකරන ලද රජයේ ඉඩම් වලට අදාල පසු කටයුතු සිදු කිරීමේ ක්‍රියාවලිය

මෙම ප්‍රධාන ක්‍රියාවලීන් තුන යටතේ අනු ක්‍රියාවලීන් රාශියක්ද නිර්මාණය කර ඇත. මෙම වැඩසටහන තුලින් පහත සඳහන් අරමුණු ඉටු කරගැනීම තුළින් පවත්නා රජයේ ඉඩම් කළමනාකරණ ක්‍රමවේදයේ පවතින අඩුපාඩු හා අකාර්යක්ෂමතාවයන් අවම කරගැනීමට අපේක්ෂිතය.

I. විධිමත් ඉඩම් පිළිබඳ දත්ත පද්ධතියක් ඇති කිරීම

II. ක්‍රියාවලීන් සඳහා ගතවන කාලය අඩු කර ගැනීම.

III. කාර්යයන් වල නිරවද්‍යතාවය ඉහළ දැමීම.

IV. මෙහෙයවීම හා ඇගයීම පහසු කරලීම.

V. අක්‍රමිකතා සඳහා ඇති ප්‍රවණතාවයන් අවම කිරීම.

### 2.6.3 රාජ්‍ය ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම

2014 වර්ෂය තුල රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 101ක ක්‍රියාත්මක කර ඇත. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව, ප්‍රවර්තන වර්ෂය තුල ක්‍රියාත්මක විම පහත සංඛ්‍යා සටහනින් දක්වා ඇත.

**රාජ්‍ය ඉඩම් කැබලිවල තොරතුරු කළමනාකරණ පද්ධතියට ඇතුලත් කිරීම**

| විස්තරය | 2014 වර්ෂයතුල සපුරාගත් ප්‍රගතිය |
|---|---|
| ඉඩම් ලේඛන ඇසුරින් තොරතුරු පද්ධතියට ඇතුලත් කිරීම් (ලේඛණ සංඛ්‍යාව) | 35,379 |
| අනුරේඛණ සහිතව ඉඩම්වල තොරතුරු පද්ධතියට ඇතුලත් කිරීම් (ඉඩම් කැබලි සංඛ්‍යාව) | 3,700 |

2014 වර්ෂය තුල රාජ්‍ය ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතියට ඇතුලත් කිරීම යටතේ ඉඩම් ලේඛන 30,000ක් ඇතුලත් කිරීමට ඉලක්කකර, ලේඛණ 35,379ක් ඇතුලත් කිරීමට දෙපාර්තමේන්තුව සමත් විය. 2015 වර්ෂය තුල මෙවැනි ඉඩම් ලේඛණ 50,000ක් ඇතුලත් කිරීමට සැලසුම්කර ඇති අතර දීමනාපත්‍ර, වාර්ෂික අවසරපත්‍ර, දීර්ඝ කාලීන බලපත්‍ර ආදී සියලු ලේඛණ මෙම පද්ධතිය උපයෝගිකර ගනිමින් මුද්‍රණය කිරීමටද සැලසුම් සකස්කර ඇත. මෙම තත්වය මහජනතාවගේ ඉඩම් ගැටලු අවමකර ගැනීම සඳහා ද ඉවහල් වීමකි.

## 2.7 රජයේ ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත්ව ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගැනීම

රාජ්‍ය ඉඩම් කළමනාකරණයේ ප්‍රමුඛයා වශයෙන් මෙම දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ඉඩම් කළමණාකරණ කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම සඳහා ඊට සම්බන්ධිත ආයතන සමග මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් විවිධ පියවර නිරන්තරයෙන් අනුගමනය කරනු ලබයි. පහත සඳහන් ක්‍රියා මාර්ග ඒ අතර ප්‍රධාන වේ.

i. ප්‍රාදේශීය ලේකම්වරුන්වෙත චක්‍රලේඛ නිකුත් කිරීම.
ii. අන්තර් පළාත් බල ප්‍රදේශවල ඉඩම් කළමනාකරණයට අදාළ නිලධාරීන් සමග ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.
iii. ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ විවිධ වැඩසටහන් වලට අදාළව ප්‍රගති සමාලෝචන රැස්වීම් හා ගැටළු සාකච්ඡා පැවැත්වීම.
iv. ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සහ අන්තර් පළාත් නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාල වල නිලධාරීන්ට පුහුණුව ලබාදීම.
v. පළාත් ඉඩම් කොමසාරිස්වරුන් සමග සම්බන්ධීකරණ රැස්වීම් පැවැත්වීම.

### 2.7.1 ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත චක්‍රලේඛ නිකුත් කිරීම

මේ යටතේ 2014 වර්ෂය තුළදී පහත සඳහන් චක්‍රලේඛ නිකුත් කර ඇත.

**අංක 2014/01 චක්‍ර ලේඛය - උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම.**

උතුරු හා නැගෙනහිර පළාත් වල පශ්චාත් ගැටුම් රජයේ ඉඩම් ගැටළු විසඳීමේ විශේෂ වැඩසටහන, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සම්බන්ධීකරණ කාර්යාලයක් ඇති කිරීම.

උතුරු හා නැගෙනහිර පළාත් වල පශ්චාත් යුධ ගැටුම් රජයේ ඉඩම් ගැටළු විසඳීමේ විශේෂ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී මහජනයාගේ පහසුව පිණිස ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල විශේෂ සම්බන්ධීකරණ කාර්යාලයක් ඇතිකිරීම සඳහා අවශ්‍ය උපදෙස් මෙමගින් එම පළාත් වල ප්‍රාදේශීය ලේකම්වරුන්ට නිකුත් කර ඇත.

**අංක 2014/02 චක්‍රලේඛය - උතුරු හා නැගෙනහිර පළාත්වල පශ්චාත් යුධ ගැටුම් රජයේ ඉඩම් ගැටළු විසඳීමේ වැඩසටහන යටතේ ගැටළු විසඳීමේ දී සැළකිය යුතු කරුණු**

අංක 2013/01 දරණ චක්‍රලේඛය මඟින් උතුරු හා නැගෙනහිර පළාත්වල ගැටුම් වලින් පසුව පැනනැගී තිබූ රජයේ ඉඩම් ගැටළු විසඳීමේ විශේෂ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් එම පළාත්වල ප්‍රාදේශීය ලේකම්වරුන්ට හා අනෙකුත් සම්බන්ධීකරණ නිලධාරීන්ට නිකුත් කරන ලදී. එහිදී උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශ සැළකිල්ලට ගෙන ඇත. මෙම උපදෙස් අනුව එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී විශේෂයෙන් හඳුනාගත් ගැටළු වර්ගයක් ලෙස බෙදාදී තිබූ රජයේ ඉඩම්වල අයිතිය සනාථ කෙරෙන ලියකියවිලි විනාශවීම හෝ අස්ථාන ගතවීම කැපී පෙනුණි. තවද ගැටුම්කාරී වාතාවරණය තුළ සිදුවූ ක්‍රියාකාරකම් නිසාම ඇතිවූ ඉඩම් අයිතිය පිළිබඳ ගැටළු කැපී පෙනුණි. මේවා විසඳීමේ දී පාදක කරගත යුතු ප්‍රතිපත්තිමය නිර්ණායක හඳුන්වාදීම අවශ්‍ය බව එම ප්‍රදේශවල ප්‍රාදේශීය ලේකම්වරුන් සමග කරන ලද සාකච්ඡා වලදී පෙනී ගිය නිසා මෙම චක්‍රලේඛය මගින් ඒ සඳහා අවශ්‍ය පොදු උපදෙස් මාලාවක් නිකුත් කරන ලදී.

**අංක 2014/03 චක්‍ර ලේඛය - ජයභූමි දීමනාපත්‍ර ලබාදී ඇති ඉඩම් මැනීම**

රේඛා චිත්‍රයක් රහිතව නිකුත් කර ඇති ජයභූමි දීමනාපත්‍ර ඉඩම් වල මායිම් පිළිබඳව සහ නිශ්චිතව ඉඩම හඳුනාගැනීම පිළිබඳව ගැටළු රාශියක් ක්ෂේත්‍ර තුලදී පැනනැගී ඇත. මේවා විසඳීම සඳහා එවැනි ගැටළු සහිත ඉඩම් මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් මැනදීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත. ඒ අනුව මෙවැනි ඉඩම් මැනීමේදී දීමනාපත්‍රයේ සඳහන් ඉඩම් ප්‍රමාණය සහ මැනීමෙන් පසුව නෛතිකව පවතින ඉඩම් ප්‍රමාණය ලෙස හඳුනාගන්නා ප්‍රමාණය අතර වෙනස්කම් පැවතීම නිසා විවිධ ගැටළු මතු වී තිබේ. එම නිසා එවැනි අවස්ථා වලදී ක්‍රියාත්මක කළ යුතු ආකාරය සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ප්‍රාදේශීය ලේකම්වරුන්ට සහ මිනින්දෝරු දෙපාර්තමේන්තුවට නිකුත් කිරීම මෙම චක්‍රලේඛය මගින් සිදු කර ඇත.

**අංක 2014/05 චක්‍රලේඛය - බිම්සවිය වැඩසටහන යටතේ 2014 වර්ෂය සඳහා දිරි දීමනා ගෙවීම**

බිම්සවිය වැඩසටහන යටතේ රජයේ ඉඩම් හඳුනාගැනීම නිරාකරණය කිරීමේ වැඩපිළිවෙල සඳහා එම වැඩසටහන 2014 වර්ෂය තුලදී ක්‍රියාත්මක කරන ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සහ ඊට දායක වූ පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාල වල හා මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා අනුමත දිරිදීමනා ක්‍රමය යටතේ දිරිදීමනා ගෙවීම සම්බන්ධයෙන් විස්තරාත්මකව උපදෙස් මෙම චක්‍රඛය මඟින් ප්‍රාදේශීය ලේකම්වරුන්ට, පළාත් ඉඩම් කොමසාරිස්වරුන්ට සහ අන්තර් පළාත් නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්වරුන්ට නිකුත් කර ඇත.

**අංක 2014/06 චක්‍රලේඛය - ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍රයක් මත ලබාදී ඇති ඉඩමක් එම පනතේ විධිවිධාන වලට පටහැනිව සකස් කරන ලද ලේඛණ මත බැහැර කිරීම.**

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කර ඇති දීමනාපත්‍ර සහිත ඉඩම් එම පනතේ සඳහන් විධිවිධාන උල්ලංඝණය කරමින් පැවරීම සිදුකරන ලද අවස්ථාවන් පිළිබඳව බෙහෙවින් තොරතුරු වාර්තා වීම නිසා ඒ පිළිබඳ 2012 වර්ෂයේ දී කරන ලද විමර්ශන වල ප්‍රතිඵලයක් වශයෙන් එවැනි නීති විරෝධී පැවරීම් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමට තීරණය කරන ලදී. එවැනි පැවරීම් නීති විරෝධී බව හෙළි වුවද ඒවා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවල ලියාපදිංචි වී තිබීම හේතුවෙන් ජනතාව අනවබෝධයෙන් එම ඉඩම් තවදුරටත් ගනුදෙනු කිරීම වළක්වා ගැනීම සඳහා නීති විරෝධී එවැනි ලියාපදිංචි කිරීම් අවලංගු කිරීම සම්බන්ධයෙන් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ රෙගුලාසියක් පැනවීමට 2012 වර්ෂයේදී පියවර ගන්නා ලදී. එම රෙගුලාසිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් පුළුල් වශයෙන් දැනුවත් කිරීමේ අවශ්‍යතාවය පෙනීගිය හෙයින් එම රෙගුලාසිය අනුව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපදෙස් එම චක්‍ර ලේඛය මඟින් නිකුත් කර ඇත.

**අංක 2014/07 චක්‍රලේඛය - රණවිරු පවුල් සඳහා රජයේ ඉඩම් ලබාදීම**

ක්‍රියාන්විත සේවයේ යෙදී සිටියදී මියගිය, අබාධිත වූ සහ අතුරුදහන්වූ රණවිරු පවුල් සඳහා රජයේ ඉඩම් ලබාදීම, රණවිරු සේවා අධිකාරිය මඟිනුත් දැනටමත් සේවයේ යෙදී සිටින හා ක්‍රියාන්විත නොවන හේතූන් මත මියගිය රණවිරු පවුල් සඳහා රජයේ ඉඩම් ලබාදීම සන්නද්ධ හමුදා හා පොලිස් සුභසාධන අංශය මගිනුත් ලබාදිය යුතු බව රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මගින් දැන්වීම, පොලිස් නිලධාරීන්ට ඉඩම් ලබාදීම නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය මඟිනුත් ලබාදිය යුතු බවත් ඊට අනුව පළාත් ඉඩම් කොමසාරිස්, නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් ක්‍රියාත්මක කල යුතු ආකාරය දැක්විය.

**අංක 2014/08 චක්‍රලේඛය - මධ්‍යම පාන්තික වැඩසටහන යටතේ බෙදා දී ඇති ඉඩම් වල අවසරපත්‍ර හා දීමනාපත්‍ර වලට අදාල පසු කටයුතු සිදුකිරීම.**

මධ්‍යම පාන්තික වැඩසටහන යටතේ බෙදා දී ඇති බලපත්‍ර හා "R" දීමනාපත්‍ර නිකුත් කර ඇති , ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍රයක් බවට පරිවර්තනය කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය එතෙක් පැවති ක්‍රියා පටිපාටිය සංශෝධන හඳුන්වා දෙමින් මෙම චක්‍රලේඛය මගින් හඳුන්වා දී ඇත. මෙම ක්‍රියාපටිපාටිය සංශෝධනය කිරීම සඳහා පළාත් ඉඩම් කොමසාරිස්වරුන් තෝරාගත් ප්‍රාදේශීය ලේකම්වරුන් කණ්ඩායමක්, මෙම දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ නිලධාරීන් පිරිසක් සහභාගී වූ වැඩමුළුවකදී සාකච්ඡාකර එළඹුණු නිගමනයන් සැළකිල්ලට ගන්නා ලදී.


## 3 පරිච්ඡේදය - ආයෝජන අවස්ථා පුළුල් කිරීම සඳහා රජයේ ඉඩම් උපයෝජනය

### 3.1 හැඳින්වීම

රජය සතු ඉඩම් ප්‍රශස්ත උපයෝජනය, ඉඩම් කළමනාකරණයේ මූලිකාංගයකි. ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය ආයෝජන කටයුතු සඳහා මූලික වශයෙන් ඉඩම් උපයෝජනය කිරීම අවශ්‍ය වේ. විවිධ සංවර්ධන හා ආයෝජන කටයුතු සඳහා ඉඩම් පැවැරීමේදී එහි ඇති විධිමත් බව මෙන්ම කාර්යක්ෂමතාවය තුළින් මෙම කර්තව්‍ය මනාව ඉටුකර ගත හැක.

### 3.2 ආයෝජන කටයුතු සඳහා ඉඩම් ලබාදීම

ඉඩම් සම්පත සීමිත ශ්‍රී ලංකාව වැනි රටක ආයෝජන අවස්ථා පුළුල් කිරීම සඳහා ඉඩම් ලබාදීම, රටේ ආර්ථික අභිවෘද්ධිය කෙරේ සෘජු දායකත්වයක් දක්වනු ලබන සාධකයකි. මේ යටතේ මෙම දෙපාර්තමේන්තුව ආරම්භයේ සිට දීර්ඝ කාලයක් තිස්සේ කෘෂි ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ඉඩම් ලබාදීමට ප්‍රමුඛත්වයක් ලබාදී ක්‍රියාත්මක කර ඇත. මේ වන විට වී නිෂ්පාදනයෙන් රට ස්වයංපෝෂිත වී ඇත . වත්මන් ආර්ථික ව්‍යුහය අනුව කර්මාන්ත, සේවා, යටිතල පහසුකම් යන අංශ සඳහා ඉහළ වැදගත්කමක් හිමි වී ඇත. ඒ අනුව එවැනි ක්ෂේත්‍රවල ආයෝජනය සඳහා ඉඩම් අවශ්‍යතාවය වැඩි වී ඇත. එම නිසා දිගු කාලීන බදු ක්‍රමය යටතේ එම ක්ෂේත්‍ර සඳහා ඉඩම් ලබාදීමේ වැදගත්කම වර්තමානයේ ඉහල ගොස් ඇත. මධ්‍යකාලීන හා දිගුකාලීන ආයෝජන අවස්ථා සඳහා රජය සතු ඉඩම් ලබාදීම සිදුකරයි. මෙමගින් ආර්ථික, සාමාජීය, යටිතල පහසුකම් මෙන්ම සමස්ථ ආර්ථික වර්ධනයට එය ඉවහල් වී ඇත. 2014 වර්ෂය තුල ආයෝජන ව්‍යාපෘති හා යටිතල පහසුකම් සඳහා ඉඩම් ලබා දීම යටතේ ඉඩම් අමාත්‍යාංශය වෙත නිර්දේශ යැවීම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් සුවිශේෂී කාර්යභාරයක් ඉටුකර ඇත.




2014 වර්ෂය තුළ ආයෝජන අවස්ථා පුළුල් කිරීමේ පරමාර්ථයෙන් ඉඩම් ලබාදීම සඳහා විශේෂ සංවර්ධන ආයෝජන ව්‍යාපෘති වෙනුවෙන් දිගු කාලීන බදු සඳහා නිර්දේශ අමාත්‍යාංශයට යැවීම් 50ක් ඉලක්ක කොට නිර්දේශ යැවීම් 66ක් සපුරා ගැනීමට සමත් විය.

## 3.3 රජයේ ඉඩම් විදේශිකයින් සඳහා පැවරීම සීමා කිරීමේ නීතිය ක්‍රියාත්මක කිරීම

### 3.3.1 හැදින්වීම

මෙරට පෞද්ගලික හා රජයේ ඉඩම්වල සින්නක්කර අයිතිය විදේශික පුද්ගලයන්ට හා නිර්දේශිත ඇස්තමේන්තුව පැවරීම සීමා කිරීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට රජය විසින් තීරණය කරන ලදී. ඒ අනුව 2013.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2008 අංක 14 දරණ ක්‍රමෝපාය සංවර්ධන පනත පනවන ලදී. මෙම පනත ක්‍රියාත්මක කිරීමේදී මුදල් විෂය භාර අමාත්‍යවරයාට යම් යම් බලතල හිමිවී ඇති අතර, රජයේ ඉඩම් සම්බන්ධයෙන් එම පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේදී ඉඩම් විෂය භාර අමාත්‍යවරයාට සහ රජයේ ඉඩම් පරිපාලනයට අදාළ නිලධාරීන්ට නිශ්චිත කාර්යභාරයක් පැවරී ඇත.

### 3.3.2 විදේශිකයින්ට රජයේ ඉඩම් පැවරීම සීමා කිරීමේ නීතිමය විධිවිධානවල මූලිකාංග

විදේශිකයින්ට රජයේ ඉඩම් පැවරීම සීමා කිරීමේ මෙම නව නීතිමය විධිවිධාන වල මූලිකාංග කිහිපයක් හඳුනාගත හැක.

I. පනතේ අර්ථ දක්වා ඇති පරිදි විදේශිකයින්ට සහ විදේශීය සමාගම් හෝ ආයතන සඳහා මෙරට ඉඩම් වල සින්නක්කර අයිතිය පැවරිය නොහැක.

II. එවැනි පුද්ගලයින් හෝ ආයතන අතුරින් පහතින් සඳහන් කරන ලද ආයතන හඳුන්වා දී ඇත. (උදා - තානාධිපති ප්‍රසාද සහිත ආයතන)

III. සින්නක්කර අයිතිය පවරනු ලැබීමට හිමිකම නොමැති පුද්ගලයින් හෝ ආයතන වලට අවුරුදු 99 ක උපරිමයකට යටත්ව දිගුකාලීන බදු ක්‍රමයට ඉඩම් ලබා ගත හැක.

IV. දිගුකාලීන බදු ක්‍රමයට ඉඩම් ලබා ගැනීමට හිමිකම ඇති පුද්ගලයින් හෝ ආයතන මුලින් අයිති කරනු ලබන විශේෂ බදු කර වල බද්දකට යටත් වේ. එම බද්ද සමහර පුද්ගලයින් හෝ ආයතන සඳහා මුළු බදු වටිනාකමින් 15% කි. සමහර පුද්ගලයින් හෝ ආයතන සඳහා එය 7 ½% ක සහනදායී බද්දකි.

V. සමහර පුද්ගලයින් හෝ ආයතන මෙම බදුකරන බද්දෙන් නිදහස් කර ඇත.

VI. සමහර දේශීය ආයෝජන වලට ඉඩම් බදු සඳහා 25% ක වට්ටමක් හිමිවේ.

VII. බදුකරන බද්ද ඉඩමට අදාල බද්දට අමතරව අය කරනු ලබන බද්දක් වන අතර එය ඉඩමේ අයිතිය පැවරීම ලියාපදිංචි කරන අවස්ථාවේදී අය කරනු ලැබේ. බදු කරන බද්ද අයකරනු ලබන්නේ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසිනි.

### 3.3.3 ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය ඉටු කිරීම

මෙම නව නීතිමය විධිවිධාන ක්‍රියාත්මක කිරිමේදී රජයේ ඉඩම් සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුවට වගකීමක් නිරන්තරයෙන්ම හිමිවේ. ඒ අනුව අදාල වර්ගීකරණයන් යටතේ වැටෙන ඉල්ලීම් හඳුනා ගැනීමටත් ඒ අනුව ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් නිර්දේශ වාර්තා ලබාගැනීමටත් ඒ තුලින් සින්නක්කර අයිතිය පැවරීම තහනම් ඉල්ලීම් ඉටු කිරීම වළක්වා ගැනීමටත් විශේෂ පියවර ගෙන ඇත. තවද බදුකරන බදු අයවිය යුතු බදු දීම් හඳුනාගෙන ඉඩම් රෙජිස්ටාර් කාර්යාල වලට යොමුකිරීම ද මෙහිදී වැදගත් වේ.


## 4. පරිච්ඡේදය - රජයේ ඉඩම් ප්‍රශස්ථ භාවිතය

### 4.1 හැඳින්වීම

රජයේ ඉඩම් ප්‍රශස්ථ මට්ටමින් භාවිතා කරමින් පූර්ණ උපයෝජනයක් සහතිකකර ගැනීම සඳහා විවිධ ප්‍රතිපත්ති උපායමාර්ග හා ක්‍රියාකාරකම් අඛණ්ඩව අනුගමනය කර ඇත. රජය සතු ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම් පාලනය කිරීමෙන්, පාරිසරික ප්‍රතිපත්ති හා නීති රීති ක්‍රියාත්මක කිරීමෙන්, ඉඩම් ගැටලු විසඳීමට නීතිමය සහ තාක්ෂණික සහාය දෙපාර්තමේන්තුව විසින් ලබාදීමෙන් රජයේ ඉඩම් ප්‍රශස්ථ ලෙස උපයෝජනය සඳහා දිරි ගැන්වීමට දෙපාර්තමේන්තුව විසින් ප්‍රයත්න දරනු ඇත.

### 4.2 රජයේ ඉඩම්වල ආරක්ෂාව තහවුරු කිරීම

රජයේ ඉඩම්වල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම් පාලනය කිරීමට විවිධ පියවර ගෙන ඇත. මේ සඳහා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව හා එක්ව දිවයිනේ පිහිටි සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රදේශීය ලේකම් කාර්යාල ඒකාබද්ධව ජාතික වැඩපිළිවෙලක් 2013 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරයි. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් 2013.07.05 දින නිකුත් කල අංක HAF/03/ADMIN/002 දරණ චක්‍රලේඛයට අනුව දිවයිනේ සෑම ග්‍රාම නිලධාරි වසමකම සෑම ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයකම අනවසරයෙන් අල්ලා ගැනීම් පාලනය පිළිබඳව පුළුල් විමර්ෂණයක් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූලිකත්වයෙන් ආරම්භ කර ඇත. මෙහිදී අනවසරකරුවන් හඳුනා ගෙන ඔවුන් ඉඩම් වලින් ඉවත් කිරීම, ඉවත් නොවන අනවසරකරුවන් හට නඩු පැවැරීම මගින් මෙම කටයුතු සිදුකර ඇත. 2014 වර්ෂය තුල එවැනි ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වීම් සිදුකරනු ලැබූ ආකාරය පහත දක්වා ඇත.




2014 වර්ෂයේ අනවසර අල්ලා ගැනීම් 2226 ක් වාර්තා වූ අතර ඉන් 479ක් ඉඩම්වලින් ඉවත් කිරීමටත් තවත් 98 දෙනෙකු සඳහා නඩු පැවැරීමටත් හැකියාව ලැබී ඇත. අනවසරකරුවන් 1630 ක් වෙනුවෙන් තවදුරටත් ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් සිටී.

## 4.3 පාරිසරික ප්‍රතිපත්ති හා නීති රීති ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා දායක වීම

### 4.3.1 හැඳින්වීම

පරිසර විෂයභාර අමාත්‍යාංශය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව වැනි ආයතන විසින් ඍජුවම සහ එම ආයතන වලට සම්බන්ධිත නොයෙකුත් ජාතික මට්ටමේ ව්‍යාපෘති යටතේ සිදුකරනු ලබන රජයේ ඉඩම්වලට සම්බන්ධ වන පරිසරය ආරක්ෂා කිරීමට අදාලව විවිධ වැඩසටහන් සැලසුම් කිරීමේදීත් ඒවා ක්‍රියාත්මක කිරීමේදීත් ඍජුවම සම්බන්ධවන ආයතනයක් ලෙස මෙම දෙපාර්තමේන්තුව සක්‍රිය දායකත්වය ලබාදී ඇත.

### 4.3.2 පාරිසරික ප්‍රතිපත්ති හා නීතිරීති ක්‍රියාත්මක කිරීම සඳහා දායක වූ වැඩසටහන්

මේ යටතේ 2014 වර්ෂයේදී පහත සඳහන් වැඩසටහන් සඳහා මෙම දෙපාර්තමේන්තුවේ සක්‍රිය දායකත්වය ලබාදී ඇත.

I. ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණය යටතේ ඉඩම් අමාත්‍යාංශයට අදාල පාර්ලිමේන්තු උපදේශන කාරක සභාවේ තීරණයක් අනුව ක්‍රියාත්මක කරන ලද ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් හා ක්‍රියාත්මක සැලැස්මක් සකස් කිරීමේ වැඩසටහන.

II. පරිසර අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් සකස් කරන ලද පරිසර හානිය අවම කිරීම සඳහා තිරසාර වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම සඳහා වූ ජාතික ක්‍රියාත්මක සැලැස්ම.

# 5. පරිච්ඡේදය - ආදායම් කළමනාකරණය කිරීම

## 5.1 හැඳින්වීම

රජයේ ඉඩම් සම්පත ප්‍රශස්ථ කළමනාකරණය තුළින් රාජ්‍ය බදු ආදායම් ව්‍යුහය ශක්තිමත් කිරීමේ සුවිශේෂී භූමිකාවක් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් ඉටු කරයි. මෙහිදී නේවාසික සහ වාණිජ කටයුතු සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන්ට, පුද්ගලයින්ට රජයේ ඉඩම් බදු දී ආදායම් රැස් කිරීම කරනු ලැබේ.


අන්තර් පළාත් ගොවි ජනපද ප්‍රදේශයන්හි ඉඩම් බදු ආදායම් රැස් කිරීම ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් ද සෙසු ප්‍රදේශයන්හි බදු ආදායම් රැස් කිරීම පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් ද වෙන් වෙන් වශයෙන් සිදු කරනු ලබයි. මූලික වශයෙන් දීර්ඝ කාලීන බදු, වාර්ෂික අවසර පත්‍ර සහ එළදා බදු මෙම ආදායම් ගනයට ගැනේ. පළාත් සභා බල ප්‍රදේශ වල බදු ආදායම පළාත් සභා වල ආදායම් ප්‍රභවයක් වුවද එම ආදායම් ප්‍රභවය සඳහා ඉඩම් බදු දීමේ ප්‍රතිපත්තිය සකස් කිරීමෙන් බදු අනුමත කිරීම සඳහා දායක වීමෙන් මෙම දෙපාර්තමේන්තුව සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලැබේ.

## 5.2 ඉඩම් බදු ආදායම ඇස්තමේන්තු කිරීම හා රැස්කිරීම

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව රැස්කල යුතු ඉඩම් බදු ආදායම් පිළිබඳව පුරෝකථනයන් කිරීම අර්ධ වාර්ෂිකව සිදුකරනු ඇත. මෙම පුරෝකථනයන් දෙස බැලීමේදී වාර්ෂිකව රැස්කල යුතු ඉඩම් බදු ආදායම් ප්‍රතිශතය ඉහළ ගොස් ඇත. මෙම තත්ත්වය රාජ්‍ය ආදායම ඉහළ යාමේ ප්‍රවණතාවයක් ද වේ. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වාර්ෂිකව රැස්කල යුතු ඉඩම් බදු ආදායම් පිළිබඳව පුරෝකතනයන් කිරීමේදී නව බදු ආදායම් රැස්කිරීම් සහ හිඟ බදු ආදායම් රැස්කිරීම් ලෙස වෙන් වෙන් ලෙස ගණනය කරනු ඇත.
සමස්තයක් ලෙස මෙම බදු ආදායම් දෙයාංශයම එක්ව ගත්කල රැස්කල යුතු බදු ආදායම් ප්‍රතිශතයට වඩා රැස්කර ගන්නා බදු ආදායම් ප්‍රතිශතය ඉහළ අගයක් ගෙන ඇත. මෙම ප්‍රවණතාවය පසුගිය වර්ෂ කිහිපයක බදු ආදායම් රැස්කිරීම් දෙස බැලීමේ දී අවබෝධ වනු ඇත. ඉඩම් නව බදුදීම ප්‍රමාණාත්මක වශයෙන් ඉහල යාමත් ඉඩම් වල තක්සේරු වටිනාකම් ඉහල යාමත් මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත. තවද නාමික වටිනාකම මත සහනදායී බදුදීම් අඩුවීමත් එකතු කිරීම විධිමත් වීමත් තවත් හේතු ලෙස දැක්විය හැක.

**බදු ඇස්තමේන්තුව හා රැස් කළ බදු ආදායම**

| | 2012 | 2013 | 2014 |
|---|---|---|---|
| බදු ඇස්තමේන්තුව (රු) | 25,000,000.00 | 35,000,000.00 | 45,000,000.00 |
| වර්ෂයේ බදු ආදායම (රු) | 34,690,642.00 | 49,503,518.68 | 44,019,324.86 |




එහිදී රැස්කල යුතු බදු ආදායමේ ඉහල යෑමේ උපනතීන් පෙන්නුම් කලද 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේදී රැස්කළ බදු ආදායම් ප්‍රතිශතය 5.5% ක පමණ සුළු පසුබෑමක් පෙන්නුම් කර ඇත. එහෙත් වර්ෂයෙන් වර්ෂයට රැස්කර ඇති බදු ආදායම් ප්‍රමාණය ඉහළ ගොස් ඇත. එමෙන්ම වාර්ෂිකව රැස්කල යුතු බදු ආදායමේ ප්‍රමාණය ඉක්මවා රැස්කර ඇති බදු ආදායම් ප්‍රමාණය ඉහළ අගයක් ගෙන ඇත. මෙම තත්ත්වයට බොහෝ සෙයින් හේතු වී ඇත්තේ අන්තර් පළාත් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ඇති බදු එකතු කිරීමේදී පැන නැගී ඇති ක්ෂේත්‍ර ගත අඩුපාඩු කම්, බදු ආදායම් රැස්කිරීම පිළිබඳව මනා පුහුණුව ලත් නිලධාරීන්ගේ හිඟය, සහ බදුකරුවන්ගේ අකල්පමය තත්ත්වයන් මීට බලපා ඇත.

බදුකරුවන් සහ බදු ආදායම් පිළිබඳව නිවැරදිව පුරෝකථනයන් නොලැබීම තුල, බදු ආදායම් ප්‍රමාණය සහ වාර්ෂිකව රැස්කර ගනු ලබන බදු ආදායම් ප්‍රමාණය අතර නොගැළපීමක් බොහෝ දුරට දක්නට ලැබේ. මෙම තත්ත්වය මග හරවා ගැනිම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව e Slims වැඩ සටහන වඩාත් විධිමත්ව මෙහෙයවිම සිදු කරනු ලබයි. එනම් නව තාක්ෂණය උපයෝගී කර ගනිමින් සකස් කරන ලද විධිමත් පාරිසරික වැඩසටහනක් තුලින් නව බදු දීම් ක්‍රියාත්මක කිරීමත් මෙතෙක් බදු දී ඇති ඉඩම් වල තොරතුරු පාරිසරික පද්ධතියට ඇතුලත් කිරීමත් දැනට ආරම්භ කර ඇත. මේ අනුව ආදායම් රැස්කිරීමට මෙහෙයවීමට වඩාත් ක්‍රමවත් ක්‍රමවේදයක් නිර්මාණය වේ. මේ තුලින් තොරතුරු යාවත්කාලීනවීමත්, අඩුපාඩු පහසුවෙන් අනාවරණය වීමක් නිසා ආදායම් කලමනාකරණය පහසු වනු ඇත. මෙම තත්වය තුල ඉදිරියේදි ඉඩම් බදු ආදායම් ව්‍යුහය වඩාත් ශක්තිමත් වනු ඇත.

## 6. පරිච්ඡේදය - මානව සම්පත් කළමනාකරණය

### 6.1 හැඳින්වීම

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ මානව සම්පත මඟින් එහි අරමුණු සාක්ෂත් කර ගැනීම සඳහා ප්‍රශස්ථව උපයෝගි කර ගැනීමට ප්‍රයත්න දරණු ලැබේ. 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේ කාර්යමණ්ඩල සංයුතියේ ඉහළ යාමක් දැක ගත හැකි විය. විශේෂයෙන්ම බඳවාගැනීම් ප්‍රමාණය ඉහළ යාම හා විශ්‍රාම ගැන්වීම් ප්‍රමාණය අඩු වීම හරහා ආයතනික කාර්යමණ්ඩලය වැඩිවීමක් ඇතිවිය. එසේම වැඩි වූ කාර්ය මණ්ඩලයට මාණ්ඩලික මෙන්ම මාණ්ඩලික නොවන සියලුම නිලධාරීන් 38 දෙනෙකු ඇතුළත් වේ. නවක නිලධාරීන් සඳහා ඉඩම් විෂය හා ආයතනික කටයුතු පිළිබඳ පුහුණුවීම් ලබා දීම 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේ ඉහළ යාමක් දක්නට ලැබුණු අතර සැලැසුම් කළ පුහුණු වැඩසටහන් ප්‍රමාණයද ඉක්මවමින් පුහුණුවීම් කටයුතු සිදු කර ඇත. විශේෂයෙන් කාර්යාල කළමනාකරණය පිළිබඳ න්‍යායික මෙන්ම ප්‍රායෝගික දැනුම ලබාදීම තුළින් ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශිය කාර්යාලයන්හි නිලධාරීන්ගෙන් මහජනයාට තෘප්තිමත් සේවයක් ලබාදීමට අඩිතාලම මෙමඟින් සකස් කරන ලදී.

### 6.1.1 කාර්ය මණ්ඩල සංයුතිය

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශිය කාර්යාල 08 කින්, සමන්විත වේ. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්මේන්තුවේ ප්‍රධානියා ලෙස ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා කටයුතු කරනු ලබයි. ඒ අනුව ඉඩම් අංශය, සංවර්ධන අංශය, පාලන අංශය, නීති අංශය හා ගිණුම් අංශය වශයෙන් අංශ 05 ක් ප්‍රධාන කාර්යාලය තුළ ක්‍රියාත්මක වේ. මෙයින් ප්‍රධාන අංශ 04 ක ප්‍රධානීන් ලෙස ඉඩම් කොමසාරිස්වරු කටයුතු කරනු ලබන අතර ගිණුම් අංශයේ ප්‍රධානියා ලෙස ප්‍රධාන ගණකාධිකාරි කටයුතු කරනු ලැබේ. 2014 සිට නව ඉඩම් කොමසාරිස් (පාලන) හා ඉඩම් කොමසාරිස් (නීති) යන තනතුරු දෙක සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ සේවා අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. අන්තර් පළාත් වාරිමාර්ග ක්‍රම යටතේ පිහිටුවා තිබෙන්නාවු ප්‍රාදේශිය කාර්යාලවල නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් හෝ සහකාර ඉඩම් කොමසාරිස්වරු යටතේ කටයුතු සිදු කරනු ලබයි

**කාර්ය මණ්ඩල සංයුතිය**

| අනු අංකය | අනුමත තනතුරු නම | අනුමත | 2014 තනතුරු සංඛ්‍යාව | 2013 වසරේ සිටි තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1. | ඉඩම් කොමසාරිස් ජනරාල් | 01 | 01 | 01 |
| 2. | ඉඩම් කොමසාරිස් | 03 | 03 | 03 |
| 3. | ඉඩම් කොමසාරිස් (නීති) | 01 | 01 | 01 |
| 4. | ප්‍රධාන ගණකාධිකාරී | 01 | 01 | 01 |
| 5. | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 01 | 01 | - |
| 6. | සහකාර / නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් | 30 | 25 | 17 |

| | | | | |
|---|---|---|---|---|
| 7. | ගණකාධිකාරී | 03 | 02 | 02 |
| 8. | මිනින්දෝරු | 01 | 04 | 03 |
| 9. | නීති නිලධාරී | 09 | 00 | 01 |
| 10. | පරිපාලන නිලධාරී | 02 | 01 | 01 |
| 11. | ජනපද නිලධාරී | 31 | 10 | 12 |
| 12. | ජ්‍යෙෂ්ඨ වැඩ අධිකාරී | 02 | 01 | 01 |
| 13. | භාෂා පරිවර්තක | 02 | 00 | 00 |
| 14. | සාමාජ විද්‍යාඥ | 01 | 01 | 01 |
| 15. | සංවර්ධන සහකාර | 260 | 179 | 160 |
| 16. | වැඩ අධිකාරී | 21 | 06 | 06 |
| 17. | ජනපද නිලධාරී | 204 | 90 | 104 |
| 18. | සැලසුම් ශිල්පී | 01 | 00 | 01 |
| 19. | කළමනාකරණ සහකාර | 160 | 120 | 120 |
| 20. | ක්ෂේත්‍ර උපදේශක | 48 | 29 | 29 |
| 21. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 05 | 02 | 02 |
| 22. | ලේඛණ භාරකරු | 01 | 01 | 01 |
| 23. | රියදුරු | 32 | 26 | 27 |
| 24. | මෝටර් කාර්මික | 01 | 01 | 00 |
| 25. | කාර්යාල කාර්ය සහායක | 32 | 18 | 18 |
| 26. | කාර්යාල කම්කරු | 15 | 15 | 15 |
| 27. | සංචාරක බංගලා භාරකරු | 05 | 04 | 02 |
| 28. | සංචාරක බංගලා කම්කරු | 05 | 05 | 05 |
| 29. | මැනුම් සහායක | 27 | 12 | 15 |
| 30. | ගබඩාකරු | 02 | 02 | 02 |
| 31. | මුරකරු | 16 | 15 | - |
| **එකතුව** | | **923** | **575** | **549** |

ඒ අනුව තනතුරු කිහිපයක අනුමත තනතුරු සංඛ්‍යාවට වඩා සේවය කරන නිලධාරීන් ප්‍රමාණය අඩු නිසා තනතුරු පුරප්පාඩු දක්නට ලැබුණි. ඒ අනුව සහකාර ඉඩම් කොමසාරිස්, ප්‍රධාන අභ්‍යන්තර විගණක, මිනින්දෝරු, ජනපද නිලධාරි, සංවර්ධන සහකාර, මෝටර් කාර්මික, සංචාරක බංගලා කම්කරු හා මුරකරු යන තනතුරුවල තනතුරු පුරප්පාඩු 2014 වර්ෂයේදී දක්නට ලැබුණි.

එසේම ඇතැම් තනතුරු පුරප්පාඩු සඳහා විවෘත පදනමින් බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කරන ලදී. 2013 වර්ෂයේ සේවයට බඳවා ගැනීම් සංඛ්‍යාවක් 04 වුවද 2014 වර්ෂයේදී එය ඉහළ ගොස් ඇති අතර සංඛ්‍යාත්මක ලෙස 38 ක් විය. ඒ අනුව දෙපාර්තමේන්තුව සඳහා බඳවා ගැනීම් ලෙස මාණ්ඩලික නිලධාරීන් 09 දෙනෙකු ද, ඇතුළුව කළමනාකරණ සහකාර ලෙස 13 දෙනෙකු ද, කාර්යාල කම්කරු ලෙස එක් අයකුද, මුරකුරු ලෙස 14 දෙනෙකු ද බඳවා ගැනීම 2014 වර්ෂයේදී සිදු කර ඇත.

## 6.1.2 ස්ථාන මාරුවීම්

2014 වර්ෂයේ දී ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලැබු නිලධාරීන් 27 දෙනෙකු ස්ථාන මාරු වී ගොස් ඇති අතර 17 දෙනෙකු ස්ථාන මාරු වී පැමිණ ඇත.

**2014 වර්ෂයේ ස්ථාන මාරු වී ගිය හා පැමිණි ගණන**

| තනතුර | ස්ථාන මාරු වී පැමිණි ගණන | ස්ථාන මාරු ගිය ගණන |
|---|---|---|
| සහකාර ඉඩම් කොමසාරිස් | 01 | 04 |
| ගණකාධිකාරී | 01 | 01 |
| සංවර්ධන නිලධාරී | 03 | 03 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 07 | 16 |
| කාර්යාල කාර්ය සහායක | 02 | 02 |
| රියදුරු | 03 | 01 |
| **එකතුව** | **17** | **27** |

### 6.1.3 විශ්‍රාම ගැනීම්

2014 වර්ෂය තුළ විශ්‍රාම ගැනීම් කිහිපයක් සිදු වී ඇත. එම විස්තරය පහත දැක්වේ.

**2014 වර්ෂයේ විශ්‍රාම ගැන්වීම්**

| තනතුර | විශ්‍රාම ගැන්වීම් |
|---|---|
| ජනපද නිලධාරී | 03 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| **එකතුව** | **04** |

ඒ අනුව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ බඳවා ගැනීම්වලට සාපේක්ෂව බලන කළ ස්ථාන මාරු වීම් හා විශ්‍රාම ගැන්වීම් මඟින් පැවති කාර්ය මණ්ඩල සංයුතියට හා ආයතනික කටයුතු සඳහා බලපෑමක් සිදු වී නොමැත.

## 6.2 ආයතනික කටයුතු

2014 වර්ෂයේ දී 2013 වර්ෂයට සාපේක්ෂව ආයතනික කටයුතු වල වර්ධනයක් දැකගත හැකිවිය. විශේෂයෙන්ම සේවයට බඳවා ගැනීම්, වැටුප් වර්ධක ගෙවීම්, ණය අනුමත කිරීම් ආදිය තුළින් මෙය නිරූපණය වේ.

2014 වර්ෂයේදී ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට නව බඳවා ගැනීම් 38 ක් සිදු කර ඇත. 2013 වර්ෂය ගත්විට එය 4 දෙනෙකුට පමණක් විය. ඒ අනුව පෙර වසරට වඩා වර්ධනයක් දැකගත හැක. නමුත් සේවය උසස් කිරීම් සඳහා විභාග පැවැත්වීම් 02 ක් 2014 වර්ෂයේ සිදු කර ඇති නමුත් සම්මුඛ පරීක්ෂණ කිසිවක් සිදු කර නොමැත.

ආයතනික කාර්ය මණ්ඩලයේ වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම් 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේ ඉහළ අගයක් ගෙන ඇත. ඒ අනුව 2013 වර්ෂයේ 201 දෙනෙකු සඳහා වැටුප් වර්ධක ගෙවා ඇති අතර 2014 වර්ෂයේදී එය 354 දෙනෙකු දක්වා වැඩිවීමක් දැකගත හැක.

මීට අමතරව සේවය හැරයාම් දෙදෙනෙකු ද නැවත සේවයේ පිහිටුවීම් 02 ක්ද, විනය පරීක්ෂණ 01ක්ද, උක්ත වර්ෂයේදී සිදු කර ඇති අතර සේවා දීර්ඝ කිරීම් හෝ වැඩ තහනම් කිරීම් කිසිවක් සිදු කර නොමැත.

### 6.2.1 උසස්වීම්

2014 වර්ෂයේ දී දෙපාර්තමේන්තුව ඇතුලත උසස්වීම් තනතුරු වර්ග 03 ක් සඳහා පමණක් සිදු වී ඇති අතර ඒ අනුව නිලධාරීන් 15 දෙනෙකු සඳහා උසස්වීම් ලැබී ඇත.

**2014 වර්ෂයේ උසස්වීම් ලබාදී ඇති තනතුරු**

| උසස්වීම් ලද තනතුරු | උසස්වීම් ලැබූ සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් | 01 |
| ජනපද නිලධාරී | 01 |
| කළමනාකරණ සහකාර | 13 |
| **එකතුව** | **15** |

### 6.2.2 සේවක සුභසාධනය

සේවක සුභසාධන කටයුතු වලදී ඉතා වැදගත් අවශ්‍යතාවක් ලෙස ණය අනුමත කිරීම් දැක්විය හැක. ඒ අනුව දේපළ, වාහන හා ආපදා ණය ලෙස ණය අනුමත කිරීම් වලින් දේපළ හා වාහන ණය සඳහා ණය ඉල්ලීම් ලැබී නොමැත. නමුත් ආපදා ණය 151 දෙනෙකු සඳහා ලබා දී ඇත. එය 2013 වසරේ 124 දෙනෙකු වෙත ලබාදී ඇති අතර මෙම වසරේ එය වැඩිවීමක් දැකගත හැක.

2014 වර්ෂයේ ආපදා ණය ලබාදීමට නොහැකි වී ඇත්තේ දෙදෙනෙකුට පමණක් වන අතර 2013 වර්ෂයේදී එය ණය ලබාදීමට නොහැකි ඉතිරි සංඛ්‍යාව 18 දෙනෙකු විය. එබැවින් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ ආයතනික කටයුතු 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේදී බඳවා ගැනීම්, වැටුප් වර්ධක ගෙවීම්, උසස්වීම්, ණය අනුමත කිරීම් ආදිය මඟින් වර්ධනයක් ලබාගෙන ඇතිබව කිව යුතුය.

### 6.3 මානව සම්පත් සංවර්ධනය

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන්නා වූ මානව සම්පත සංවර්ධනය සඳහා විවිධ පුහුණු වැඩසටහන් සංවිධානය කරනු ලබයි. ඒ අනුව දේශීය මෙන්ම විදේශීය පුහුණු වැඩසටහන්ද මෙමගින් ක්‍රියාත්මක කරනු ලැබ ඇත. විශේෂයේම පුහුණු වැඩසටහන් හරහා කාර්යමණ්ඩල සාමාජිකයින්ගේ දැනුම, කුසලතා, ආකල්ප වර්ධනයට කටයුතු කරනු ලැබේ.

ඒ අනුව 2014 වර්ෂයේ දී පුහුණු කිරීම් සහ හැකියා වර්ධනය සඳහා අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන මුදල් රුපියල් 2,500,000/- වෙන් වූ අතර වියදම රුපියල් 2,398,679/- ක් විය. මෙම පුහුණු සංවර්ධන වැඩසටහන් පහත සඳහන් අයුරින් 2014 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කර ඇත.

**2014 වර්ෂයේ පවත්වනු ලබු දේශිය පුහුණු වැඩසටහන්**

| විෂය | සැලැසුම් කළ පුහුණු වැඩසටහන් ගණන | පවත්වා ඇති පුහුණු වැඩසටහන් ගණන | පුහුණුකළ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| දෙපාර්තමේන්තු මඟින් නිලධාරීන් පුහුණු කිරීම | 12 | 15 | 1220 |
| දෙපාර්තමේන්තු නිලධාරීන් පුහුණු ආයතනවලට යොමු කිරීම | 06 | 17 | 37 |
| බාහිර පුහුණු ආයතනවල අනුග්‍රාහයෙන් | - | - | 55 |
| එකතුව | **18** | **32** | **1312** |

2014 වර්ෂයේදි දේශිය පුහුණු වැඩසටහන් සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මුලික ලෙස අවධානය යොමු කර ඇත. විශේෂයෙන්ම ඉඩම් විෂය තාක්ෂණික විෂයක් බැවින් සහ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාර්ය රජයේ ඉඩම් කළමනාකරණය ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම බැවිනුත් ඉඩම් විෂය ආශ්‍රිත පුහුණු වැඩසටහන් සඳහා විශේෂ අවධානයක් යොමු කර ඇත. ඒ අනුව ඉඩම් විෂයට අදාළ පුහුණු වැඩසටහන් මඟින් මාණ්ඩලික මෙන්ම මාණ්ඩලික නොවන නිලධාරීන් 245 දෙනෙකු පුහුණු කර ඇත. මේ සඳහා පුහුණු වැඩසටහන් 02 ක් සංවිධානය කර ඇත. එක් පුහුණු වැඩසටහනක් මගින් දෙපාර්තමේන්තුවේ සේවය කරන මාණ්ඩලික හා මාණ්ඩලික නොවන නිලධාරීන් 90 දෙනෙකු හට පුහුණුව ලබා දි ඇත. අනෙක් පුහුණු වැඩසටහන මගින් ක්ෂේත්‍රයේදී පැන නගින ගැටළු සම්බන්ධයෙන් ක්ෂේත්‍ර නිලධාරී 155 දෙනෙකු පුහුණු කර ඇත.

ඉහත දක්වනු ලැබූ පුහුණු පාඨමාලා විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ මාණ්ඩලික නිලධාරීන් හා මාණ්ඩලික නොවන නිලධාරීන් යන සියලු දෙනාගේ සහභාගිත්වයෙන් සිදු කර ඇත.

2014 වර්ෂය ගත්විට මාණ්ඩලික නිලධාරීන් හය දෙනෙකු පශ්චාත් උපාධි පාඨමාලාවන් සඳහා යොමු කර ඇති අතර රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් එක් අයකු සඳහා ද අවස්ථාව ලබා දී ඇත.

මීට අමතරව මාණ්ඩලික නිලධාරීන් හා මාණ්ඩලික නොවන නිලධාරීන් සඳහා එකවර සහභාගි වන පුහුණු වැඩසටහන් සංවිධානය කර ඇත.

**2014 වර්ෂයේ මාණ්ඩලික හා මාණ්ඩලික නොවන නිලධාරීන් සහභාගි වූ පුහුණු වැඩසටහන්**

| විෂය ක්ෂේත්‍රය | පුහුණුව ලැබූ නිලධාරින් |
|---|---|
| කාර්යමණ්ඩල ආකල්ප වර්ධනය | 200 |
| කාර්යාල ක්‍රම, වැටුප් පරිවර්ථනය කිරීම හා ගිණුම් ක්‍රම | 500 |
| ඉඩම් විෂය | 155 |
| **එකතුව** | **855** |

දෙපාර්තමේන්තුවේ අරමුණු කාර්යක්ෂමතාවයෙන් ද, ඵලදායිතාවයෙන්ද යුතුව ඉටු කර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා ගැනීම සඳහා ඉහත පුහුණු වැඩසටහන් අරමුණු කර ගන්නා ලදී. ඒ අනුව දෙපාර්තමේන්තුවේ ඵලදායිතාව ඉහළ නංවා ගැනීමට මෙමගින් අවකාශය සැලසුනි.

විශේෂයෙන් ආයතනික නිලධාරින් කාර්යාල කටයුතු පිළිබඳ පුහුණු වීම් හරහා මහජනතාව වෙත තෘප්තිමත් සේවයක් ලබා දීමට අවශ්‍ය පසුබිම නිර්මාණය විය.

එසේම එක් එක් දීප ව්‍යාප්ත සේවාවන්ට අදාළ විවිධ පුහුණු වැඩසටහන් 2014 වර්ෂයේදී සිදු කර ඇත.

**2014 වර්ෂයේ පුහුණු වැඩසටහන්**

| විෂය ක්ෂේත්‍රය | දීප ව්‍යාප්ත සේවාව | පුහුණුව ලැබූ නිලධාරින් |
|---|---|---|
| භාෂා පුහුණු | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 50 |
| නවක සංවර්ධන නිලධාරින් දැනුවත් කිරීම | සංවර්ධන නිලධාරී සේවය | 87 |
| ප්‍රසම්පාදන ක්‍රියාවලිය | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 01 |
| මුදල් ප්‍රවාහය සහ කළමනාකරණය | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 01 |
| **එකතුව** | | **139** |

මෙහිදී දෙපාර්තමේන්තුව හා සම්බන්ධව නවක සංවර්ධන නිලධාරින්ට ඉඩම් විෂය පිළිබඳ දැනුමක් ලබා දීම ඉහත පුහුණු වැඩසටහන්වලදී සිදුවිය. මේ ආකාරයට දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් මෙන්ම මාණ්ඩලික නොවන නිලධාරීන් හට ද රාජකාරී කටයුතු කිරීමේදී අත්‍යවශ්‍ය වන විවිධ ක්ෂේත්‍රයන්ට අදාළ පුහුණු වැඩසටහන් 2014 වර්ෂයේදී මානව සම්පත් සංවර්ධනය සඳහා පවත්වා ඇත. එසේම විශේෂිත පුහුණු වැඩසටහන් ද එනම්, රැකියා ජීවිතයේදී මෙන්ම පෞද්ගලික ජීවිතයේදී උපකාරී වන පුහුණු වැඩටහන් ද පවත්වා ඇත. එනම්, ගිනි ආරක්ෂණ පුහුණුව සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මෙන්ම ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශ නිලධාරීන් ද ඇතුළුව තිස්එක් දෙනෙකු සහභාගි වී ඇත.

2014 වර්ෂය ගත්විට සැලසුම් කළ පුහුණු වැඩසහටන් ප්‍රමාණය ඉක්මවා ආයතනික නිලධාරින් පුහුණු කිරීම සඳහා වැඩසටහන් රාශියක් පවත්වා තිබීම විශේෂිත කරුණක් ලෙස දැක්වීමට පුළුවන. පෙර වර්ෂයේදී ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව දේශිය පුහුණු සඳහා මූලිකත්වය ලබාදෙමින් දෙපාර්තමේන්තු අරමුණු ඉටු කර ගැනීමට ප්‍රධානත්වය ලබාදුන් අතර විදේශ පුහුණු සඳහා මෙමගින් අවකාශය නොලැබුණි.

## 7. පරිච්ඡේදය - භෞතික සම්පත් කළමනාකරණය

## 7.1 හැඳින්වීම

2014 ප්‍රවර්තන වර්ෂය තුල නිශ්චල හා චංචල ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම් හා මිලදී ගැනීම් පහළ මට්ටමක පැවතුනු අතර, රජයේ ඉඩම් පිළිබඳ තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීමේ වැඩසටහනට සමගාමීව නව යටිතල පහසුකම් ලෙස පරිගණක යන්ත්‍ර හා පරිගණක මුද්‍රණ යන්ත්‍ර මිලදී ගැනීම සඳහා ප්‍රාග්ධන වියදම් යටතේ වැඩිපුර ප්‍රතිපාදන යොදවා ඇත.

2014 වර්ෂය ආරම්භය තුල පැවති ස්ථාවර වත්කමෙහි විශාල ප්‍රමාණික වෙනසක් වර්ෂය තුල සිදුවී නොමැති බව නිරීක්ෂණය වන අතර නිශ්චල හා චංචල දේපලවල වෙන්දේසි කිරීම් හා අපහරණය ඉතා අඩු මට්ටමක පැවතීමෙන් දෙපාර්තමේන්තුවේ භෞතික සම්පත් කාර්යක්ෂමව මනාව කළමනාකරණය කිරීමෙහිලා සමත්වී ඇති බව දත්ත අනුව ගම්‍ය වේ.

## 7. 2 භෞතික සම්පත් සංයුතිය හා සිදු වු වෙනස්කම් සහ ප්‍රසම්පාදන කටයුතු, භාණ්ඩ අපහරණය

නිශ්චල වත්කම් කාණ්ඩය යටතේ නව ගොඩනැගිලි ඉදිකිරීම් සිදු නොකිරීම හා දෙපාර්තමේන්තුවට නව ඉඩම් අත්පත් කර ගැනීම් නොකිරීම නිසා 2013 වර්ෂයේ මෙන්ම 2014 වර්ෂයේදී නිශ්චල වත්කම් කාණ්ඩයේ ශේෂයන් ස්ථාවරව පැවැතුණි.

2014 වර්ෂයේදී චංචල වත්කමෙහි වෙන්දේසි කිරීම් හා අපහරණ තත්ත්වයන් හේතු කොටගෙන චංචල වත්කම් කාණ්ඩ කිහිපයක්ම මුල පැවති ශේෂයන්ට වඩා පහල ගොස් ඇති අතර ලී බඩු වල අපහරණ තත්ත්වය අනෙක් වත්කම් කාණ්ඩයන්ට සාපේක්ෂව ප්‍රමාණිකව ඉහළ ගොස් ඇත.

E - Slims හා බිම්සවිය ව්‍යාපෘතීන් සඳහා යටිතල පහසුකම් අවශ්‍ය වීම හේතු කොටගෙන පරිගණක හා උපාංග වත්කම් කාණ්ඩයන් මිලදී ගැනීම් හේතුවෙන් වර්ෂය තුල පැවති ශේෂයන්ට වඩා තරමක ඉහළ අගයක් ගෙන ඇත. මෙම තත්වය පහත නිශ්චල සහ චංචල දේපල පිළිබඳ වගු සටහන් නිරීක්ෂණය කිරීම තුලින් අවබෝධ කර ගත හැක.

### නිශ්චල දේපල

| අනු අංකය | වත්කම් වර්ගය | වසර ආරම්භයේ පැවැති තත්ත්වය | වර්ෂය තුළ සිදුවන ලද වෙනස් වීම් | | | | වසර අවසානයේ පැවැති තත්වය |
|---|---|---|---|---|---|---|---|
| | | | අත්පත්කර ගැනීම් | මිළදී ගැනීම් | වෙන්දේසි කිරීම | පැවරීම | |
| 01 | ඉඩම්(හෙක්.) | 87.8511 | - | - | - | - | 87.8511 |
| 02 | ගොඩනැගිලි | 300 | - | - | - | - | 300 |
| 03 | ඉදිකිරීම් | - | - | - | - | - | - |

වංචල දේපල

| අනු අංකය | වත්කම් වර්ගය | වසර ආරම්භයේ පැවැති තත්ත්වය | වර්ෂය තුළ සිදුවනලද වෙනස්වීම් | | | | වසර අවසානයේදී පැවැති තත්වය |
|---|---|---|---|---|---|---|---|
| | | | අත්පත්කර ගැනීම් | මිළ දී ගැනීම | වෙන්දේසි කරීම | අපහරණය | |
| 01 | කැබ් රථ | 17 | 07 | - | 02 | - | 22 |
| 02 | මෝටර් රථ (ජීප් රථ සහ | 12 | - | - | - | - | 12 |
| 03 | වෑන් රථ | 01 | - | - | - | - | 01 |
| 04 | පාගන සයිකල් | 10 | - | - | - | - | 10 |
| 05 | ඡායා පිටපත් යන්ත | 16 | - | 01 | 01 | - | 16 |
| 06 | පරිගණක | 77 | - | 26 | - | - | 103 |
| 07 | පරිගණක ප්‍රින්ටර්ස් | 54 | - | 11 | 02 | 01 | 62 |
| 08 | ෆැක්ස් යන්ත | 14 | - | - | | - | 14 |
| 09 | යතුරු ලියන | 52 | - | - | 02 | - | 50 |
| 10 | සේප්පු | 05 | - | - | - | - | 05 |
| 11 | රූපවාහිනී යන්ත | 10 | - | - | - | - | 10 |
| 12 | රේඩියෝ යන්ත | - | - | - | - | - | - |
| 13 | ශීතකරණ | 07 | - | - | - | - | 07 |
| 14 | අල්මාරි (වානේ හා ලී) | 246 | - | - | 17 | 03 | 226 |
| 15 | මේස (වානේ හා ලී) | 474 | - | - | 06 | 04 | 464 |
| 16 | පුටු | 752 | - | - | 17 | 39 | 696 |
| 17 | රාක්ක | 232 | - | - | - | 04 | 228 |
| 18 | ස්ටෑන්ඩ් ෆෑන් | 04 | - | - | 02 | 01 | 01 |
| 19 | රෝනියෝ මැෂින් | 06 | - | - | - | - | 06 |
| 20 | විදුලි කේතල | 20 | - | - | 05 | 03 | 12 |
| 21 | ෆිල්ටර් | 22 | - | - | 01 | - | 21 |
| 22 | රයිස් කුකර් | 04 | - | - | - | - | 04 |
| 23 | ගෑස් ලිප් | 06 | - | - | - | - | 06 |
| 24 | වායු සමීකරණ | 25 | - | - | - | - | 25 |
| 25 | ඉස්තික්ක | 07 | - | - | 01 | - | 06 |
| 26 | ගිනි නිවන | 16 | - | - | - | - | 16 |
| 27 | බ්ලෙන්ඩර් | 02 | - | - | - | - | 02 |
| 28 | ගණක යන්ත | 160 | - | - | 06 | 05 | 149 |
| 29 | බිම් තරාදි | 10 | - | - | - | - | 10 |
| 30 | වැකුම් ක්ලීනර් | 04 | - | - | - | - | 04 |
| 31 | පොලිෂර් | 03 | - | - | - | - | 03 |
| 32 | තණකොළ කපන යන්ත | 01 | - | - | - | 01 | - |
| 33 | බෝඩ් කපන යන්ත | 02 | - | - | - | - | 02 |
| 34 | කඩදාසි කපන යන්ත | 01 | - | - | - | - | 01 |
| 35 | පරිගණක මේස | 78 | - | - | 01 | - | 77 |
| 36 | පරිගණක පුටු | 96 | - | - | 09 | - | 87 |
| 37 | ඇහිලි සලකුණු යන්ත | 02 | - | - | - | - | 02 |
| 38 | ඉලෙක්ට්‍රික් ගිල් හැමැර් | 01 | - | - | - | - | 01 |
| 39 | මල්ටි මීටර් | 01 | - | - | - | - | 01 |
| 40 | අත් පතිකා රාක්ක | 01 | - | - | - | - | 01 |
| 41 | ඩිජිටල් කැමරා | 02 | - | - | - | - | 01 |
| 42 | ලැප්ටොප් පරිගණක | 05 | - | - | 01 | - | 05 |
| 43 | ඇඳන් (තේක්ක) | 03 | - | - | - | - | 03 |
| 44 | මල්ටි මීඩියා ප්‍රොජෙක්ටර් | 01 | - | - | - | - | 01 |
| 45 | පෙන් ඩ්‍රයිව් 4GB | 14 | - | - | - | - | 14 |
| 46 | යු.පී.එස්. යන්ත | 41 | - | - | 04 | - | 37 |
| 47 | වැරැන්ඩා පුටු | 12 | - | - | - | - | 12 |
| 48 | කෑම මේස (තේක්ක) | 01 | - | - | - | - | 01 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 49 | කෑම මේස පුටු | 20 | - | - | - | - | 20 |
| 50 | ග්‍රයින්ඩර් | 02 | - | - | - | - | 02 |
| 51 | විධායක පුටු | 22 | - | - | - | - | 22 |
| 52 | විධායක මේස | 29 | - | - | - | - | 29 |
| 53 | සෝෆා සෙට් | 01 | - | - | - | - | 01 |
| 54 | මීඩ් බැක් පුටු | 52 | - | - | - | - | 52 |
| 55 | අමුත්තන්ගේ පුටු | 86 | - | - | - | - | 86 |
| 56 | ලොබි පුටු | 20 | - | - | - | - | 20 |
| 57 | අයන් ටේබල් | 01 | - | - | - | - | 01 |
| 58 | රූපවාහිනී රදවන | 01 | - | - | - | - | 01 |
| 59 | ඩුප්ලෙක්ස් යුනිට් | 01 | - | - | - | - | 01 |
| 60 | දිග බංකු | 19 | - | - | - | - | 19 |
| 61 | අඳන් | 23 | - | - | - | - | 22 |
| 62 | ගෑස් සිලින්ඩර් | 01 | - | - | - | - | 01 |
| 63 | එල්.සී.ඩී.මොනිටර් | 02 | - | - | - | - | 02 |
| 64 | කණ්නාඩි මේස | 10 | - | - | - | - | 10 |
| 65 | මහෝගනී ඔෆිස් කබඩ් | 04 | - | - | - | - | 04 |
| 66 | Low Back Chair | 115 | - | - | - | - | 115 |
| 67 | බිත්ති ඔරලෝසු | 02 | | - | - | - | 02 |
| 68 | රෙගියුලේටර් | 01 | - | - | - | - | 01 |
| 69 | සැන්ටා ඩයිනින් සෙට් | 05 | - | - | - | - | 05 |
| 70 | විවේක පුටු | 04 | - | - | 01 | - | 03 |
| 71 | වයිට් බෝඩ් | 01 | - | - | - | - | 01 |
| 72 | ඉනිමග | 04 | - | - | - | - | 04 |
| 73 | රවුටර් | 01 | - | - | - | - | 01 |
| 74 | කී බෝඩ් | 01 | - | - | - | - | 01 |
| 75 | බොයිලේරු | 01 | - | - | 01 | - | - |
| 76 | පිගන් රාක්ක | 01 | - | - | - | - | 01 |
| 77 | ප්ලාස්ටික් පුටු | 70 | - | - | - | - | 70 |
| 78 | ස්කෑනර් | 02 | - | - | - | - | 02 |
| 79 | පුස්තකාල අල්මාරි | 02 | - | - | - | - | 02 |
| 80 | බයිකඩර් | 01 | - | - | - | - | 01 |
| 81 | කෑම මේස | 02 | - | - | - | - | 02 |
| 82 | අයන්කබඩ් | 02 | - | - | - | - | 02 |
| 83 | රිචාජබල් ටෝච් | 02 | - | - | - | - | 02 |
| 84 | බුක් රැක් | 02 | - | - | - | - | 02 |
| 85 | ලොබි ස්ටූල් | 01 | - | - | | - | 01 |
| 86 | රෙදි සෝදන යන්ත්‍ර | 01 | - | - | - | - | 01 |
| 87 | කබඩ් | 05 | - | - | - | - | 05 |
| 88 | ටවල් රැක් | 02 | - | - | - | - | 02 |
| 89 | ලී ඇඳි පුටු | 12 | - | - | - | - | 12 |
| 90 | මෙට්ට | 04 | - | - | - | - | 04 |
| 91 | ෆිලින් කැබිනට් | 38 | - | - | - | - | 38 |
| 92 | පෙන් ඩ්‍රයිව් 8GB | 07 | - | - | - | - | 07 |
| 93 | TV ඇන්ටනා | - | - | 01 | - | - | 01 |

## 7.3 ගබඩා කළමනාකරණය

ගබඩා කළමනාකරණය, ගබඩා සමීක්ෂණ වාර්ෂික තොග පොත් තබා ගනිමින් සිදු කරනු ලබයි. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන කාර්යාලය හා උප කාර්යාල මට්ටමින් මෙම කටයුතු සාර්ථකව සිදු කර ඇත.

**ගබඩා සමීක්ෂණ**

| අනු අංකය | කාර්යාලය | භාණ්ඩ සමීක්ෂණය කළ කාර්යාල ගණන |
|---|---|---|
| 01 | ප්‍රධාන කාර්යාලය | 01 |
| 02 | රත්මලාන ලෝක ආහාර ගබඩාව | 01 |
| 03 | මීපිළිමාණ සංචාරක බංගලාව | 01 |
| 04 | අනුරාධපුර නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය | 01 |
| 05 | අනුරාධපුර සංචාරක බංගලාව | 01 |
| 06 | අනුරාධපුර උප කාර්යාලය | 32 |
| 07 | පොළොන්නරුව නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය | 01 |
| 08 | පොළොන්නරුව සංචාරක බංගලාව | 01 |
| 09 | පොළොන්නරුව උප කාර්යාලය | 11 |
| 10 | ත්‍රිකුණාමලය නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය | 01 |
| 11 | ත්‍රිකුණාමලය උප කාර්යාලය | 08 |
| 12 | කන්තලේ සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය | 01 |
| 13 | කන්තලේ සංචාරක බංගලාව | 01 |
| 14 | කන්තලේ උප කාර්යාලය | 06 |
| 15 | දෙබරවැව නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය | 01 |
| 16 | කතරගම සංචාරක බංගලාව | 01 |
| 17 | හම්බන්තොට සංචාරක බංගලාව | 01 |
| 18 | දෙබරවැව උප කාර්යාලය | 05 |
| 19 | මහියංගනය නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය | 01 |
| 20 | මහියංගනය සංචාරක බංගලාව | 01 |
| 21 | මහියංගනය උප කාර්යාලය | 15 |
| 22 | අම්පාර නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය | 01 |
| 23 | අම්පාර (උහන) සංචාරක බංගලාව | 01 |
| 24 | අම්පාර උප කාර්යාලය | 16 |
| 25 | මොණරාගල සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය | 01 |
| 26 | මොණරාගල සංචාරක බංගලාව | 01 |
| 27 | මොණරාගල උප කාර්යාලය | 04 |
| | **එකතුව** | **116** |

# 8 මූල්‍ය කළමනාකරණය

## 8.1 හැඳින්වීම

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මූල්‍ය කළමනාකරණය විවිධ ශීර්ෂයන් ඔස්සේ වියදම් දැරීම, ආදායම් උත්පාදනය, ඇස්තමේන්තු සකස් කිරීම, අත්තිකාරම් ගිණුම් පවත්වා ගැනීම, භෞතික සම්පත් කළමනාකරණය, ගබඩා සමීක්ෂණය, විගණන කටයුතු සිදු කිරීම යන අංශ ඔස්සේ සිදුකරනු ලබයි.

## 8.2 අයවැය කළමනාකරණය

දෙපාර්තමේන්තුවට අදාළ සංවර්ධන කටයුතු පිළිබඳ වැඩසටහන් යටතේ, ක්‍රියාත්මක කරනු ලබන අන්තර් පළාත් ඉඩම් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පරිපාලන සඳහා අරමුදල් සම්පාදනය කර ගැනීම අයවැය කළමනාකරණයේ ප්‍රධාන කාර්යභාරය වන අතර, ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධාකාර වැඩසටහන් සඳහා ප්‍රතිපාදන උපයෝජනයද මේ මගින් සිදුවේ.

ඒ අනුව ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

1. රන්බිම දීමනාපත්‍ර පිළියෙල කිරීම.
2. ඉඩම් කච්චේරි හා ජංගම සේවා පැවැත්වීම.
3. දෙපාර්තමේන්තුව සතු නිල නිවාස, සංචාරක බංගලා සහ කාර්යාල ගොඩනැගිලි පුනරුත්ථාපනය.
4. භෞතික සම්පත් ප්‍රසම්පාදනය.
5. කාර්ය මණ්ඩල පුහුණුව හා හැකියා වර්ධනය.

ඉහත සඳහන් කල තොරතුරුවලට අදාළව ප්‍රතිපාදන උපයෝජනය කළ ආකාරය පසුගිය වසර හා සංසන්දනාත්මකව පහත වගුව මඟින් දක්වා ඇත.

**අයවැය කළමනාකරණය**

| 855-40-01 | 2013 | | | වියදමේ ප්‍රතිශතය | 2014 | | | වියදමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රතිපාදන (රු.) | වියදම (රු) | ඉතිරිය (රු) | | ප්‍රතිපාදන (රු.) | වියදම (රු) | ඉතිරිය (රු) | |
| ව්‍යාපෘති 1 | | | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 156,000,000 | 155,384,206 | 615,794 | 99.61 | 194,150,000 | 192,944,685 | 1,205,315 | 99.38 |
| වෙනත් පුනරාවර්තන | 50,130,000 | 47,654,282 | 2,475,718 | 95.06 | 54,450,000 | 52,073,191 | 2,376,308 | 95.63 |
| ප්‍රාග්ධන | 51,600,000 | 50,014,138 | 1,585,862 | 96.93 | 89,100,000 | 87,126,871 | 1,973,129 | 97.79 |
| 2001 | 28,000,000 | 27,581,635 | 418,365 | 98.51 | 48,500,00 | 48,440,562 | 59,438 | 99.88 |
| 2002 | 900,000 | 792,3114 | 107,686 | 88.03 | 900,000 | 891,162 | 8,838 | 99.02 |
| 2003 | 4,500,000 | 4,470,030 | 29,970 | 99.33 | 5,000,000 | 4,980,419 | 49,581 | 99.61 |
| 2102 | 5,000,000 | 4,978,216 | 21,784 | 99.56 | 3,000,000 | 2,999,350 | 650 | 99.98 |
| 2104 | 1,000,000 | 983,007 | 16,993 | 98.30 | 1,000,000 | 926,630 | 73,370 | 92.66 |
| 2105-1 | 1,200,000 | 1,142,144 | 57,856 | 95.18 | 1,200,000 | 1,174,563 | 25,437 | 97.88 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 2105-2 | 4,000,000 | 3,416,129 | 583,871 | 85.40 | 4,000,000 | 3,994,287 | 5,713 | 99.86 |
| 2105-3 | - | - | - | - | 3,000,000 | 1,432,830 | 1,567,190 | 47.76 |
| 2401 | 2,000,000 | 1,918,596 | 81,404 | 95.93 | 2,500,000 | 2,398,679 | 101,321 | 95.95 |
| 2502-1 | 5,000,000 | 4,732,067 | 267,933 | 94.64 | - | - | - | - |
| 2502-2 | - | - | - | - | 20,000,000 | 19,888,389 | 111,611 | 99.44 |
| **එකතුව** | **257,730,000** | **253,052,626** | **4,677,374** | **98.19** | **337,700,000** | **332,144,747** | **5,555,253** | **99.35** |

2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේදී පුනරාවර්තන වියදම් ඉහල යෑමක් සිදුව ඇති අතර පුනරාවර්තන වියදම තුල සේවක සංඛ්‍යාව වැඩි වීමට සාපේක්ෂව පෞද්ගලික පඩිනඩි වැඩිවීම ඊට හේතු වී ඇති ප්‍රධානතම සාධකය වී ඇත.

පෙර වර්ෂයට සාපේක්ෂව ප්‍රාග්ධන වියදම් කාණ්ඩය තුල රජයේ ඉඩම් පිළිබඳව තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීම සහ රජයේ ඉඩම් සංරක්ෂණය සඳහා නව වැය ශීර්ෂයන් 2ක් (පිළිවෙලින් 2502-1සහ2105-3) එක්ව ඇති අතර ඒ මත ප්‍රාග්ධන වියදම් කාණ්ඩය ඉහළ යාමට හේතු වී ඇත. එමෙන්ම පෙර වර්ෂයන්හි දී ප්‍රාග්ධන වියදම් කාණ්ඩයේ වැය ශිර්ෂයක්ව පැවති උස්බිම් සංවර්ධනය සඳහා වූ වැය ශිර්ෂය 2014 ප්‍රවර්තන වර්ෂයේදී ප්‍රාග්ධන වියදමෙන් ඉවත්ව ඇත. අනෙකුත් වැය ශිර්ෂයන් එලෙසම පැවතුන අතර පෙර වර්ෂයන්ට සාපේක්ෂව ප්‍රාග්ධන වියදම් සඳහා ලැබී ඇති හා වියදම් සඳහා ප්‍රතිපාදන උපයෝජිත ප්‍රතිශතයන් සුළු ඉහළ යෑමක් පෙන්නුම් කර ඇත. මනා භෞතික සම්පත් කළමනාකරණයක් තුළ ප්‍රාග්ධන වියදම් අදාල ප්‍රතිපාදන සීමාවන් තුළම රඳවා ගැනීමට දෙපාර්තමේන්තුව සමත්වී ඇත.

## 8.3 රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම

දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සඳහා අත්තිකාරම් හා ණය ලබාදීම පිණිස මූල්‍ය පහසුකම් සපයා ගැනීම මෙම අත්තිකාරම් ගිණුම මඟින් සිදුකරනු ලබන අතර ඒ අනුව 2014 වර්ෂය තුළදී ද පහත සඳහන් පරිදි ලැබුණු අත්තිකාරම් හා ණය ඉල්ලුම්පත් සම්පූර්ණ කොට ඇත.

**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම**

| අනු අංකය | ණය වර්ගය | ඉල්ලුම් කළ සංඛ්‍යාව | ලබා දුන් සංඛ්‍යාව | මුදල රු. |
|---|---|---|---|---|
| 01 | විශේෂ ණය අත්තිකාරම් | 140 | 140 | 350.000.00 |
| 02 | උත්සව අත්තිකාරම් | 400 | 400 | 2,000,000.00 |
| 03 | ආපදා ණය | 143 | 116 | 11,593,545.13 |
| 04 | පා පැදි ණය | - | - | - |
| | එකතුව | 683 | 656 | 13,943,545.13 |

නියමිත සීමාවන් පිළිපදිමින් අදාළ අත්තිකාරම් ගිණුම මෙහෙය වූ ආකාරය පසුගිය වසර හා සංසන්දනාත්මකව පහත වගුව මඟින් දක්වා ඇත.

**අත්තිකාරම් ගිණුම මෙහෙයවූ ආකාරය**

| සීමාවන් | 2013 | | | එකතුව B+C | 2014 | | | එකතුව B+C |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුව A | තත්‍ය | | | ඇස්තමේන්තුව A | තත්‍ය | | |
| | | සීමාවට බලපාන B | සීමාවට බල නොපාන C | | | සීමාවට බලපාන B | සීමාවට බල නොපාන C | |
| වියදමේ උපිරිම සීමාව | 19,000,000.00 | 13,657,950.46 | 4,753,234.74 | 18,411,185,20 | 14,000,000 00 | 13,943,545.15 | 3,442,456.06 | 17,386,001.21 |
| අවම බැර සීමාව | 11,000,000.00 | 14,586,513.79 | 5,943,083.58 | 20,529,597.37 | 12,000,000 00 | 12,049,330.99 | 3,432,773.00 | 15,482,103.99 |
| උපරිම හර ශේෂ සීමාව | 85,000,000.00 | 51,517,005.97 | 1,075,030.84 | 50,441,975.13 | 70,000,000 00 | 52,551,660.33 | 0.0 | 52,551,660.33 |

2014.01.01 දින වන විට අත්තිකාරම් B ගිණුමේ ණය ශේෂය වශයෙන් රු. 715, 033.35 ක නිරවුල් නොවූ ණය ශේෂයක් තිබූ අතර එම ණය ශේෂය 1999 ඔක්තෝම්බර් 18 දිනැති රාජ්‍ය චක්‍රලේඛ අංක 369 ට අනුව කටයුතු කර රු. 239, 325.00 ක ණය ශේෂයක් නිරවුල් කර ගැනීමට හැකියාව ලැබුණි. ඉතිරි ණය ශේෂයන් අය කර ගැනීම සඳහා තවදුරටත් අවශ්‍ය පියවර ගනිමින් සිටී.

තවද ඉහත ගැටළුව නැවත ඇති නොවීම සඳහා වර්තමානයේදී අප විසින් පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.

I. නිලධාරියෙක් ස්ථාන මාරුවී යන අවස්ථාවේදී වැටුප් විස්තරය සමග ණය ශේෂය නිරවුල් කර ගත යුතු ආකාරය දන්වා යැවීම.

II. අදාළ ආයතනය විසින් මාස 03 ක් ඇතුලත ණය ශේෂය නොපියවන්නේ නම් ලිපි මඟින් නැවත දැනුම්දීම.

III. දිගින් දිගටම සිහි කැඳවීම් කළද ණය නිරවුල් නොකරන්නේ නම් අදාල ආයතන දැනුවත් කර මාරුපත්‍ර මගින් එම දෙපාර්තමේන්තුවට ණය ශේෂය හර කිරීම.

IV. විශ්‍රාම ගිය නිලධාරියෙකුගේ ණය ශේෂය පියවීමට අවශ්‍ය ප්‍රතිපාදන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ලබා දී නොමැති නම් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත අදාළ තොරතුරු දැනුම් දී ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු කිරීම.

## 8.4 විගණන කටයුතු

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ විගණන කටයුතු වාර්ෂිකව රජයේ විගණන දෙපාර්තමේන්තුව විසින් හා දෙපාර්තමේන්තු අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරනු ලබයි. අභ්‍යන්තර විගණනය සහ රජයේ විගණන කටයුතු සාපේක්ෂව සිදු කර ඇති ආකාරය පහත වගු සටහන් මඟින් දක්වා ඇත.

**අභ්‍යන්තර විගණන කටයුතු**

| | 2013 | 2014 |
|---|---|---|
| පැවැත්වූ විගණන පරීක්ෂණ ගණන | 09 | 09 |
| ඉන් වසර තුළ පිළිතුරු සැපයූ ගණන | 08 | 09 |

**රජයේ විගණන කටයුතු**

| | 2013 | 2014 |
|---|---|---|
| පැවැත්වූ විගණන පරීක්ෂණ ගණන | 05 | 11 |
| ඉන් වසර තුළ පිළිතුරු සැපයූ ගණන | 05 | 11 |

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ විගණන කටයුතු සිදුකිරීමේ දී, අභ්‍යන්තර විගණන කටයුතු සහ රජයේ විගණන කටයුතු සඳහා නිසි පරිදි පිළිතුරු ලබාදී ඇත.

වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මේ අඩංගු ක්‍රියාකාරකම් අනුව අභ්‍යන්තර විගණන පරීක්ෂණ 17ක් පරීක්ෂා කිරීමට සැලසුම් කල අතර 2014 වර්ෂය අවසන් වන විට අභ්‍යන්තර විගණන පරීක්ෂණ 09ක් අවසන් කිරීමට හැකියාව ලැබුණි.